ශ්‍රී ලංකා නැගෙනහිර විශ්ව විද්‍යාලය

கிழக்குப் பல்கலைக் கழகம், இலங்கை

EASTERN UNIVERSITY, SRI LANKA

වාර්ෂික වාර්තාව

வருடாந்த அறிக்கை - 2012

ANNUAL REPORT

ශ්‍රී ලංකා නැගෙනහිර විශ්ව විද්‍යාලය

වාර්ෂික වාර්තාව - 2012

පටුන

		පිටුව
1.	දැක්ම ප්‍රකාශනය	01
2.	මෙහෙවර ප්‍රකාශනය	01
3.	උපකුලපති වරයාගේ සමාලෝචනය	01
4.	සම්පත් සහ ශිෂ්‍යයන් පිළිබඳ තොරතුරු	07
5.	දේශීය ශිෂ්‍යයන් පිළිබඳ තොරතුරු	08
6.	අධ්‍යයන කාර්ය මණ්ඩල තොරතුරු	09
7.	අනධ්‍යයන කාර්ය මණ්ඩල තොරතුරු	10
8.	පර්යේෂණ, නවෝත්පාදන සහ ප්‍රකාශන පිළිබඳ තොරතුරු	11
9.	වැඩසටහන්, සම්මන්ත්‍රණ හා වැඩමුළු විස්තර	12
10.	ප්‍රදාන ලැබීම් පිළිබඳ තොරතුරු	13
11.	ආරම්භ කරන ලද නව පාඨමාලා පිළිබඳ විස්තර	14
12.	පුනරාවර්තන වියදම් විස්තර	14
13.	ප්‍රාග්ධන වියදම් විස්තර	15
14.	ව්‍යාපෘති විස්තර (දේශීය/විදේශීය ආධාර)	16
15.	ව්‍යාපෘති වියදම් විස්තර (දේශීය/විදේශීය ආධාර)	17
16.	මූල්‍ය ප්‍රගතිය පිළිබඳ විස්තර (වියදම්)	18
17.	මූල්‍ය ප්‍රගතිය පිළිබඳ විස්තර (ආදායම් ජනිතවීම්)	18
18.	මූල්‍ය ක්‍රියාකාරීත්වය විශ්ලේෂණය - 2012	19
19.	වෙනත් තොරතුරු/මෙම වාර්තාවට අදාල කාර්යය සාධනය	19
20.	2012 දෙසැම්බර් 31 වනදායින් අවසන් වූ වසර සඳහා ශ්‍රී ලංකා විශ්වවිද්‍යාලයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපති වාර්තාව	20
21.	විගණනකාධිපති වරයාගේ වාර්තාව සම්බනධයෙන් වන කළමනාකරණ ප්‍රතිචාරය	29

1. දැක්ම ප්‍රකාශනය:

ප්‍රාදේශීය සහ ගෝලීය තත්ත්වයන්ගේ වෙනස්වීම්වලට ප්‍රතිචාර දැක්වීමට හැකි, උසස් අධ්‍යාපනය සහ පර්යේෂණ යන අංශ වල තරගකාරී වාසියක් ලබාගත හැකි, විශිෂ්ඨ වූ ජාතික මට්ටමේ මධ්‍යස්ථානයක් පිහිටුවීම; ශ්‍රී ලංකා නැගෙනහිර විශ්ව විද්‍යාලයේ අභිප්‍රායයි.

2. මෙහෙවර ප්‍රකාශනය:

ඉගෙනීම සහ පර්යේෂණ උපයෝජනය ධෛර්යමත් කරමින්, ප්‍රජා සුභසාධනය, සෞභාග්‍යය සහ සංස්කෘතිය ඔප් නැංවීම මෙන්ම අපේක්ෂිත ජයග්‍රාහී ඉලක්කයන් සාර්ථකව ළඟා කර ගැනීම සඳහා සම්පත් ආරක්ෂා කරගැනීම සහ ඒවා කාර්යක්ෂමව පාලනය කිරීම සඳහා, ඉගැන්වීම, පර්යේෂණ පැවැත්වීම සහ ශිෂ්‍යත්ව ලබාදීම යන අංශයන්හි විශිෂ්ඨත්වය ළඟාකරගැනීම වෙනුවෙන් එය සතු අභ්‍යන්තර සහ බාහිර පීඨයන්, මණ්ඩප සහ අනෙකුත් පහසුකම් හරහා, ප්‍රතිලාභ ලබා ගත හැකි, සැම දෙනා සඳහාම අධ්‍යාපන සහ පුහුණුවීම යන අංශයන්හි අනභිභවනීය අවස්ථා ලබාදීම ශ්‍රී ලංකා නැගෙනහිර විශ්ව විද්‍යාලයේ අපේක්ෂාවයි.

3. උපකුලපති තුමාගේ සමාලෝචනය:

අ. විශ්වවිද්‍යාලය පිලිබඳ කෙටි හැඳින්වීම

ශ්‍රී ලංකා නැගෙනහිර විශ්වවිද්‍යාලය, 1981 වසරේ අගෝස්තු මස 01 වන දින විද්‍යා සහ කෘෂිකර්ම යන පීඨයන් දෙකකින් සමන්විත "මඩකලපුව විශ්වවිද්‍යාල කෝලීජය" නමින් පේරාදෙනිය විශ්වවිද්‍යාලය හා අනුබද්ධිතව ආරම්භ කරන ලදී. එය පසුව 1986 වසරේ ඔක්තොම්බර් මාසයේ දි වාණිජ්‍ය හා කළමනාකරණ පීඨය සහ කලා හා සංස්කෘතික පීඨය ලෙස අමතර පීඨයන් දෙකක් සමඟින් පූර්ණ විශ්වවිද්‍යාලයක් තත්ත්වයට උසස් කරන ලදී. සෞඛ්‍ය ආරක්ෂන විද්‍යා පීඨය 2006 වසරේ දි, මානව ජීව විද්‍යා, පරිපූරක සෞඛ්‍ය විද්‍යා, ව්‍යාධි භෞතවේද, වෛද්‍ය අධ්‍යයන හා පර්යේෂණ, සායනික විද්‍යා සහ ප්‍රාථමික සෞඛ්‍ය ආරක්ෂන ලෙස අධ්‍යයනාංශ 06 කින් සමන්විතව ආරම්භ කරන ලදී.

නැගෙනහිර විශ්වවිද්‍යාලයේ ත්‍රිකුණාමල මණ්ඩපය, සන්නිවේදන හා ව්‍යාපාර අධ්‍යයන පීඨය සහ ව්‍යවහාරික විද්‍යා පීඨය යන පීඨයන් දෙකකින් සමන්විතව 2001 වසරේ ජූලි මස 15 වන දින ආරම්භ කරන ලදී. මේ වන විට එය සිද්ධා වෛද්‍ය ඒකකයකින් ද සමන්විතව වේ.

ස්වාමි විපුලානන්දා සෞන්දර්‍ය අධ්‍යයන ආයතනය, 2005 වසරේ මාර්තු මස 01 වන දින නැගෙනහිර විශ්වවිද්‍යාලය හා අනුබද්ධ කරන ලදී. 1981 වසරේ එය ආරම්භ කළ අවස්ථාවේ සිට නැගෙනහිර විශ්වවිද්‍යාලය හා අනුබද්ධ කළ අවස්ථාව දක්වා "ස්වාමි විපුලානන්දා සංගීත හා නැටුම් විද්‍යාලය" නමින් ප්‍රාදේශීය කටයුතු සහ හින්දු සංස්කෘතික අමාත්‍යාංශය යටතෙත් පසුව සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය යටතෙත් පැවතිනි.

පීඨයන් සහ වැඩසටහන්

- **විද්‍යා පීඨය** අධ්‍යයනාංශ 05 කින් සමන්විත වන අතර ජීව විද්‍යා හා භෞතික විද්‍යා විද්‍යාවේදී උපාධි, විද්‍යා අධ්‍යාපන විද්‍යාපති උපාධිය, දර්ශනපති හා ආචාර්ය (M.Phil and Ph.D) යන පර්යේෂණ උපාධි ද පිරිනමයි.
- **කෘෂිකර්ම පීඨය** අධ්‍යයනාංශ 06 කින් සමන්විත වන අතර කෘෂිකර්ම විද්‍යාවේදී උපාධියත් කෘෂිකර්ම විද්‍යාපති උපාධියත් පිරිනමයි.
- **කලා හා සංස්කෘතික පීඨය** අධ්‍යයනාංශ 09 කින් සමන්විත වන අතර කලාවේදී, අධ්‍යාපනවේදී, ශාස්ත්‍රපති, අධ්‍යාපන ශාස්ත්‍රපති, දර්ශනපති හා ආචාර්ය යනාදී උපාධින් විවිධ අංශවලින් පිරිනමයි.
- **වාණිජ හා කළමනාකරණ පීඨය** අධ්‍යයනාංශ 03 කින් සමන්විත වන අතර වාණිජවේදි, ව්‍යාපාර කළමනාකරණවේදි, කළමනාකරණ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව, ව්‍යාපාර කළමනාකරණ ශාස්ත්‍රපති සහ සංවර්ධන ආර්ථික ශාස්ත්‍රපති යනාදි උපාධින් පිරිනමයි.
- **සෞඛ්‍ය ආරක්ෂණ විද්‍යා පීඨය** අධ්‍යයනාංශ 06 කින් සමන්විත වන අතර වෛද්‍යවේදි හා ශල්‍යවේදි (MBBS) සහ හෙද විද්‍යාවේදී උපාධිය පිරිනමයි.
- **ත්‍රිකුණාමලය මණ්ඩපය,** සන්නිවේදන හා ව්‍යාපාර අධ්‍යයන පීඨය, ව්‍යවහාරික විද්‍යා පීඨය යන පීඨ දෙකකින් සහ සිද්ධා වෛද්‍ය ඒකකයකින් සමන්විත වන අතර ගණකාධිකරණ හා මූල්‍ය කළමනාකරණ විද්‍යාවේදී උපාධිය, භාෂා හා සන්නිවේදන අධ්‍යයනයෙහි කලාවේදී උපාධිය, පරිගණක විද්‍යා උපාධිය, තොරතුරු තාක්ෂණ උපාධිය සහ සිද්ධ වෛද්‍ය හා ශල්‍යකර්ම උපාධිය යනාදී උපාධින් පිරිනමනු ලැබේ.
- **බාහිර උපාධි සහ ව්‍යාප්ත පාඨමාලා මධ්‍යස්ථානයඃ** විශ්වවිද්‍යාල අධ්‍යාපනය වැඩි සිසුන් ප්‍රමාණයකට ලබා දීම සඳහා අවස්ථාව උදාකර දීමට පීඨයන් මගින් බාහිර උපාධි පිරිනමයි. මෙම වැඩසටහන් බාහිර උපාධි සහ ව්‍යාප්ත පාඨමාලා මධ්‍යස්ථානය හරහා සිදු කරනු ලැබේ.

ආ. වාර්තා

- "පශ්චාත් ගැටුම් ප්‍රතිසාධනය සඳහා දැනුම සහ තාක්ෂණය" යන මාතෘකාව යටතේ වූ ජාත්‍යන්තර සම්මන්ත්‍රනය 2012 සැප්තැම්බර් මස 12 සහ 13 වන දිනවල පැවැත් වුනු අතර එහි දී බංගලාදේශයේ ඩාකා විශ්වවිද්‍යාලය සහ සිංගප්පූරුවේ ජාතික විශ්වවිද්‍යාලය ආදියෙන් ආරාධිත දේශකයන් සහභාගී වූහ.
- "Webometric" විශ්වවිද්‍යාල සම්බන්ධ ජාත්‍යන්තර ශ්‍රේණිගත කිරීමේ දී නැගෙනහිර විශ්වවිද්‍යාලය 2011 වසර සිට 2012 වසර වන විට ස්ථාන 720 ක් පෙරට පැමිණ වර්තමානයේ 12,124 වන ස්ථානයේ ඇත.
- විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ අනුමැතිය සමඟ පාසැල් ගුරුවරුන්ගේ දැනුම වර්ධනය කිරීමට සහ ගුණාත්මක කිරීමට විද්‍යා අධ්‍යාපන ශාස්ත්‍රපති උපාධි පාඨමාලාව ආරම්භ කර ඇත.
- පූර්ව ළමා සහ ප්‍රාථමික අධ්‍යාපන අධ්‍යාපනවේදි උපාධි පාඨමාලා ආරම්භ කර ඇත.
- උසස් අධ්‍යාපන අමාත්‍යාංශය විසින් පවත්වනු ලැබූ "කවිතා ටැලන්ට් ෂෝ" තරඟයේ සම්මාන 17 ක් හිමිකර ගෙන ඇත.
- මූල්‍ය ක්‍රියාකාරකම්වල පැවැති අඩුපාඩු නිවැරදි කොට ක්‍රමවත් කරන ලදී.
- සෞඛ්‍ය ආරක්ෂණ විද්‍යා පීඨයේ ශිෂ්‍යයන් විසින් "මෙඩිස්කොප් 2012" ප්‍රදර්ශනය පවත්වන ලදී.

- ○ කැනඩාවේ සිට මාගේ ශ්‍රී ලංකා ආගමනය බුද්ධිමතුන් රට හැර යෑම වෙනුවට, මෙරටට නැවත පැමිණීම පෙන්විය හැකි අතර තවත් බුද්ධිමතුන් කීපදෙනෙක් රටට පැමිණීමට කැමැත්ත පලකර ඇත.
- ○ යුද්ධය සහ පටු සිතුවිලි හේතුවෙන් පෙර නොතිබුනු ඉගෙනුම් සහ ඉගැන්වීම් කටයුතු සඳහා හිතකර පරිසරයක් විශ්වවිද්‍යාලය තුල ගොඩනගා ඇත.
- ○ වසර කීපයක් තිස්සේ ඇන හිට තිබුනු පොදු රාජ්‍ය මණ්ඩල විශ්වවිද්‍යාල සංගමයේ සාමාජිකත්වය නැවතත් අලුත් කරන ලදී.
- ○ අන්තර්ජාල සර්වර් එකේ පැවැති අඩුපාඩු මගහරවා පැය 24 පුරා ක්‍රියාත්මක වන ආකාරයට සකස් කරන ලදී.
- ○ විවෘත කේත මෘදුකාංගයක් වන “New Gen Lab” නැගෙනහිර විශ්වවිද්‍යාල පුස්තකාල ශාඛාවල ස්ථාපනය කොට ඉ-අධ්‍යයන ද්‍රව්‍යයන් හට පහසුවෙන් ප්‍රවේශ විම හා ලබා ගැනීමට හැකි තත්ත්වයක් උදාකර දීම තුලින් ශිෂ්‍ය සහ කාර්යය මණ්ඩල පර්යේෂණ ක්‍රියාකාරකම් වැඩි දියුණු කරගත හැක.
- ○ ඩෙංගු ව්‍යාප්තිය සහ පිලිකා ආදි සම්බන්ධ දැනුවත් කිරීම සඳහා හා අපගේ ශිෂ්‍යයන් අතරේ සමාජ එකමුතුකම ඇති කිරීම සඳහාත් සංස්කෘතික වැඩසටහන්, වීදි නාට්‍ය සහ වැඩමුළු පවත්වන ලදී.
- ○ කාර්යය මණ්ඩල සංවර්ධන මධ්‍යස්ථාන හරහා අධ්‍යයන සහ අනධ්‍යයන කාර්යය මණ්ඩල සේවකයන්ගේ දැනුම සහ නිපුණතා වැඩි දියුණු කිරීම සඳහා විවිධ වැඩමුළු පවත්වන ලදී.
- ○ කෙටි කාලයක් තුල යටිතල පහසුකම් වැඩි දියුණු කිරීම තුලින් ඉගෙනුම් සහ ඉගැන්වීම් කටයුතු සඳහා සුදුසු පරිසරයක් ගොඩනගන ලදී.
  - ගොඩනැගිලි ඉදිකිරීමේ ව්‍යාපෘති
    1. විද්‍යා පීඨයේ සත්ත්ව විද්‍යා අංශ ගොඩනැගිල්ල රු. මිලියන 199 වියදමින් ඉදිකොට 2013 පෙබරවාරි මස 5 වන දින අතිගරු ජනාධිපති තුමන් අතින් විවෘත කරන ලදී.
    2. කලා හා සංස්කෘතික පීඨයේ ගොඩනැගිලි සංකිරණය 2013 සැප්තැම්බර් අග වන විට ඉදිකොට නිම කිරිමට නියමිතය. (මුලු ඇස්තමේන්තු වියදම රු. මිලියන 121)
    3. පුස්තකාලය සඳහා නව ගොඩනැගිල්ල 2013 සැප්තැම්බර් අග වන විට ඉදිකොට නිම කිරිමට නියමිතය. (මුලු ඇස්තමේන්තු වියදම රු. මිලියන 171)
    4. වානිජ හා කළමනාකරණ පීඨයේ ගොඩනැගිලි සංකිරණය 2013 ඔක්තෝම්බර් අග වන විට ඉදිකොට නිම කිරිමට නියමිතය. (මුලු ඇස්තමේන්තු වියදම රු. මිලියන 230)
    5. ත්‍රිකුණාමලය මණ්ඩපයේ විද්‍යාගාරයෙහි ඉදිකිරීම් 15% ක් දක්වා අවසන් කොට ඇත.
    6. ත්‍රිකුණාමලය මණ්ඩපයේ ශිෂ්‍ය විනෝදායන මධ්‍යස්ථානයෙහි ඉදිකිරීම් 10% ක් දක්වා අවසන් කොට ඇත.
  - පහත අනුමැතිය ලද ව්‍යාපෘතින් ප්‍රසම්පාදන අදියරේ පවති:
    1. සෞඛ්‍ය ආරක්ෂණ විද්‍යා පිඨය සඳහා ගොඩනැගිලි සංකිරණය (මුලු ඇස්තමේන්තු වියදම රු. මිලියන 360)
    2. කලා හා සංස්කෘතික පිඨය සඳහා ශ්‍රවනාගාරය සහිත දේශන ශාලාව (මුලු ඇස්තමේන්තු වියදම රු. මිලියන 44.6)
    3. සෞඛ්‍ය ආරක්ෂණ විද්‍යා පිඨයේ මහාචාර්ය ඒකකය සඳහා ගොඩනැගිලි සංකිරණය (මුලු ඇස්තමේන්තු වියදම රු. මිලියන 299)
    4. ත්‍රිකුණාමලය මණ්ඩපයේ ක්‍රිඩා පිටිය (මුලු ඇස්තමේන්තු වියදම රු. මිලියන 50)
  - ත්‍රිකුණාමල මණ්ඩපයේ පහත සඳහන් ව්‍යාපෘතින් සඳහා ලංසු කැඳවා ඇත.
    1. තොරතුරු තාක්ෂණ මධ්‍යස්ථානය

2. පුස්තකාලය
3. ව්‍යවහාරික විද්‍යා පීඨය සඳහා ගොඩනැගිල්ල

- කෘෂි පීඨය සඳහා නව ගොඩනැගිලි සංකීරණයක් ඉදිකිරීමට ව්‍යාපෘති යෝජනාවක් සකසා උසස් අධ්‍යාපන අමාත්‍යාංශයේ නිර්දේශය සහිතව ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුවට එහි අනුමැතිය සඳහා යොමු කොට ඇත. (මුලු ඇස්තමේන්තු වියදම රු. මිලියන 303)
- සිද්ධ වෛද්‍ය ඒකකයේ ගොඩනැගිල්ල ඉදිකිරීම කාර්ය සඳහා උපදේශක සේවා සපයන්නෙකු පත් කිරීමේ කාර්යයෙහි පවති.
- 2011/2012 වසර අතිරේක සිසුන් බඳවා ගැනීම සඳහා මුලු ඇස්තමේන්තු මුදල රු. මිලියන 91.9 වියදමින් සිදු කරන අර්ධ ස්ථිර ගොඩනැගිලි:
  1. වන්තාරුමූලේහි විභාග ශාලාව ඉදිකිරීම් නිම කොට ඇත.
  2. කෘෂිකර්ම පීඨයේ සිසුන් 150 සඳහා දේශන ශාලාව ඉදිකිරීම් නිම කොට ඇත.
  3. වානිජ හා කළමනාකරණ පීඨයේ සිසුන් 300 සඳහා දේශන ශාලාව ඉදිකිරීම් නිම කොට ඇත.
  4. විද්‍යා පීඨයේ සිසුන් 350 සඳහා දේශන ශාලාව ඉදිකිරීම් නිම කොට ඇත.
  5. සෞඛ්‍ය ආරක්ෂණ විද්‍යා පීඨයේ සිසුන් 300 සඳහා දේශන ශාලාව සහ කාර්යය මණ්ඩල කාමරය ඉදිකිරීම් නිම කොට ඇත.
  6. ත්‍රිකුණාමලය මණ්ඩපයේ සිසුන් 150 සඳහා දේශන ශාලාව ඉදිකිරීම් නිම කොට ඇත.
  7. ශිෂ්‍ය ක්‍රීඩාගාරයේ ශාලාව ඉදි කිරීම් නිම විමට පවති.
- සිසුන් සඳහා නේවාසිකාගාර පහසුකම් සැපයිමේ ප්‍රගතිය පහත පරිදි වේ:
  1. ස්ථිර ගොඩනැගිලි

අ.අ.	ව්‍යාපෘති	ප්‍රගතිය
1.	සෞඛ්‍ය ආරක්ෂණ විද්‍යා පීඨයේ පිරිමි සිසුන් 250 සඳහා නේවාසිකාගාරය	2013.09.11 දිනැති ප්‍රවෘත්ති පත්‍ර දැන්වීම් මගින් ලංසු කැඳවනු ලැබීය.
2.	නැගෙනහිර විශ්වවිද්‍යාලයේ වන්තාරුමූලෙහි පිරිමි සිසුන් 250 සඳහා නේවාසිකාගාරය (උ. අ. අ. සුනාමි පුනරුත්ථාපන ව්‍යාපෘති යටතේ)	සැලසුම් නිර්මාණය සහ ගොඩනැගීම් පදනම මත මධ්‍යම ඉංජිනේරු උපදේශක කාර්යාංශයට (CECB) පිරිනමන ලදි.
3.	නැගෙනහිර විශ්වවිද්‍යාලයේ වන්තාරුමූලෙහි ගැහැණු සිසුන් 400 සඳහා නේවාසිකාගාරය	කැබිනට් මණ්ඩල අනුමැතියෙන් පසු ප්‍රසම්පාදන මට්ටමේ ඇත.
4.	ත්‍රිකුණාමලය මණ්ඩපයේ පිරිමි සිසුන් 250 සඳහා නේවාසිකාගාරය	10% කින් ඉදිකිරීම් අවසන් කොට ඇත.
5.	ත්‍රිකුණාමලය මණ්ඩපයේ ගැහැණු සිසුන් 250 සඳහා නේවාසිකාගාරය	10% කින් ඉදිකිරීම් අවසන් කොට ඇත.

  2. අර්ධ ස්ථිර ගොඩනැගිලි

අ.අ.	ව්‍යාපෘති	ප්‍රගතිය
1.	සෞඛ්‍ය ආරක්ෂණ විද්‍යා පීඨයේ සිසුන් 80 සඳහා නේවාසිකාගාරය	ඉදිකිරීම් අවසන් කොට සිසුන්ගේ භාවිතයට ලබා දී ඇත.
2.	වන්තාරුමූලෙහි පිරිමි සිසුන් 100ක් හා ගැහැණු සිසුන් 100 සඳහා නේවාසිකාගාර (පියවර II)	ඉදිකිරීම් අවසන් කොට සිසුන්ගේ භාවිතයට ලබා දී ඇත.

- උපාධිධාරින්ගේ වෘත්තීමය හැකියාව වැඩිකිරීම සඳහා පහත ක්‍රියාමාර්ග ගෙන ඇත.

i. අපගේ උපාධිදරයින්ගේ ඉංග්‍රීසි භාෂා සන්නිවේදන හැකියාව වැඩි දියුණු කිරීම සඳහා ඉංග්‍රිසි භාෂා උපදේශකයින් කිහිපදෙනෙකු කාර්යය පැවරුම් පදනම මත (on assignment basis) පත් කොට ඇත.
ii. රැකියා අපේක්ෂිත උපාධිදරයින්ගේ සිට රැකියා බිහිකරන උපාධිදරයින් තත්ත්වයට පත් කිරීම සඳහා QIG අරමුදල තුලින් ''සේවා නියුක්ත හා ව්‍යවසායකත්ව නිපුනතා වර්ධනය කිරීමේ මධ්‍යාස්ථානයක්'' පිහිටු විමට අවශ්‍ය කටයුතු කර තිබේ.
iii. උපාධිදරයින්ගේ වෘතීමය හැකියාව දියුණු කිරීමට තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ කුසලතා වැඩි දියුණු කිරීම සඳහා පියවර ගෙන ඇත.
iv. ශිෂ්‍ය ඇගයීම් මගින් ඉගැන්වීමේ ගුණාත්මක භාවය වැඩි දියුණු කිරීම සඳහා පියවර ගෙන ඇත.
v. ඉගැන්වීම් හා ඉගැනීම් සඳහා නව වෙබ් අඩවියක් සකසමින් පවතින අතර එය නොබෝ දිනකින් දියත් කරනු ලැබේ.
vi. ත්‍රිභාෂා වැඩ සටහන් හඳුන්වා දීමට පියවර ගෙන ඇත.
vii. පවතින වැඩසටහන් වලට අමතරව උපාධිදරයින්ගේ පුහුණු වැඩසටහන් වැඩි දියුණු කිරීමට කර්මාන්තකරුවන් සමග සාකච්ඡා කිහිපයක් පවත්වා ඇත.
viii. කලා පීඨයේ කලාවේදි උපාධි විෂය මාලාවට මූලික ගණිතය සහ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ අනිවාර්ය විෂයන් ලෙස ඇතුලත් කරමින් විෂය මාලාව වෙනස් කොට ඇත.

ඇ. අභියෝග

නේවාසික පහසුකම්

- විශ්වවිද්‍යාලයේ වර්තමාන ශිෂ්‍යයන්ගේ ප්‍රමාණය නව ඇතුලතත් කිරීම් සමඟ 5364 ක් වේ . අපගේ විශ්වවිද්‍යාලය ශිෂ්‍යයන් 1614 දෙනෙකුට පමණක් නේවාසික පහසුකම් ලබාදිය හැකි තත්ත්වයේ පවතී. නැගෙනහිර විශ්වවිද්‍යාලය පෞද්ගලික නේවාසික පහසුකම් නොමැති දුර ප්‍රදේශයක පිහිටා ඇත. එබැවින් අපට ප්‍රථම වසර හා අවසන් වසර ශිෂ්‍යයන්ට නේවාසික පහසුකම් ලබාදීමේ සාමාන්‍ය ක්‍රමයෙන් බැහැර වී සියලුම ශිෂ්‍යයන් වෙත නේවාසික පහසුකම් ලබාදිය යුතුව ඇත. එසේ වුවද අනුමත ව්‍යාපෘති සියල්ල අවසන් වුවහොත් නේවාසික පහසුකම් ලබාදීමේදී කිසිදු ගැටළුවක් මතු නොවන බව මා සිතමි.
- වසර 30 ක යුද්ධය හේතුවෙන් අපේ සේවකයන්ගේ මානසිකත්වයට විශාල බලපෑමක් එල්ල වී තිබුනි. එම නිසා ඔවුන් එම දැඩි බවෙන් මිදීම සඳහා වැඩි නම්‍යතාවයක් බලාපොරොත්තු වෙයි. ඔවුන්ගේ මෙම ආකල්පය වෙනස් කර ඔවුන් සංවිධානය කිරීම සඳහා අඩුම තරමින් කෙටි කාලයකටවත් විදේශ රටවල පුහුණු වීමේ අවස්ථාවන් සලසා දිය යුතුය. මේ සඳහා රජය අතිරේක ප්‍රතිපාදන ලබාදිය යුතුය.
- අඛණ්ඩව පැවැති යුද්ධය හේතුවෙන් සීමාකරන ලද සංචාර ගමනාගමනයන් අපේ සේවකයන්ගේ සන්නිවේදන හැකියාව සීමා කරන ලදි. මෙයද අපේ විශ්වවිද්‍යාලය ජාත්‍යන්තර මට්ටමට ගෙන ඒම සඳහා බාධාවක් විය.
- ධනාත්මක ආකල්පයක් ගොඩනැගීම සඳහා අපේ ශිෂ්‍යයන්ට අත්‍යාවශ්‍ය විනෝදාංශ පහසුකම් නොතිබිනි. අපේ ශිෂ්‍යයන්ගෙන් මතුවෙන දක්ෂතා වර්ධනය කිරීමට ක්‍රීඩා සහ විනෝදාංශ පහසුකම් පිළිබඳ වැඩි අවධානය යොමු කළ යුතුය.
- ප්‍රමාණවත් සේවකයන් නොමැති වීම සහ වත්මන් සේවකයන්ගේ අඩු හැකියාව හේතුවෙන් දත්ත සහ ලේඛණ නඩත්තු කිරීම සඳහා ප්‍රධාන කාර්ය අංශ විශ්වවිද්‍යාලය සතු නොමැත. "සැලසුම් අංශය", "නීති සහ ලේඛණගත කිරීමේ අංශය" සහ "දත්ත කළමනාකරණ අංශය" වැනි අංශ ඇතුලත් ප්‍රධාන කාර්ය අංශ පිහිටුවීම සඳහා අමතර සේවකයන් ලබාදිය යුතුය.

- පසුගිය වසර කීපයක් තුල නැගෙනහිර විශ්වවිද්‍යාලයේ ස්ථිර මූල්‍යාධිකාරිවරයෙකු නොසිටියේය. මෙය අපේ ඉලක්කගත අරමුණ කරා ලඟා වීමට බාධාවක් විය. ස්ථිර මූල්‍යාධිකාරිවරයෙකු පත්කර ගැනීම සඳහා විවිධ අවස්ථාවන්වල උත්සාහ කළ ද එය අසාර්ථක වුනී. මෙවැනි තත්ත්වයක් මත විශ්වවිද්‍යාලය පරිපාලනය කිරීම විශාල අභියෝගයක් වී ඇත.
- පරිශ්‍රය තුල සේවකයන් සඳහා වන නේවාසික පහසුකම් අවම මට්ටමේ පවතී.
- නැගෙනහිර විශ්වවිද්‍යාලය පහත් බිම් ප්‍රදේශයක පිහිටා ඇති බැවින් සෑම වර්ෂයක් පාසාම ක්ෂණික හා නිරන්තර ගංවතුර බලපෑම්වලට මුහුණ දෙයි. මෙය වලක්වා ගැනීම සඳහා නව වාස්තුවිද්‍යාරූපී සැලසුම් ඉදි කළ යුතුය.

ඇ. අනාගත සැලසුම්

- ජාත්‍යන්තර තත්ත්වයේ වෘතීමය හැකියාවැති උපාධිලාභීන් බවට පත්වීමට අපගේ ශිෂ්‍යයන්ට ගුණාත්මක අධ්‍යාපනයක් ලබා දීම සඳහා යටිතල පහසුකම් සහ විද්‍යාගාර පහසුකම් වැඩි කිරීම.
- පර්යේෂණ සඳහා වැඩි මුදලක් වෙන් කිරීම. උදාහරණයක් වශයෙන් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ පර්යේෂණ මුදලට අමතරව 2013 වසරේ රුපියල් මිලියන තුනක මුදලක් පර්යේෂණ කටයුතු දිරි ගැන්වීම සඳහා වෙන්කරන ලදී.
- සෑම වසරකම ජාත්‍යන්තර පර්යේෂණ සම්මන්ත්‍රණ සංවිධානය කිරීම.
- ජාත්‍යන්තර "වෙබොමෙට්‍රික්"ශ්‍රේණිගත කිරීමේදී අපගේ විශ්වවිද්‍යාලය පළමු 5000 තුලට ගෙන ඒම සඳහා කමිටුවක් පත්කර ඇත. මෙයට උපකාරී වනසේ අපගේ විශ්වවිද්‍යාල වෙබ් අඩවිය පරිශීලක මිත්‍ර, පර්යේෂණ ප්‍රකාශන සහ වෙනත් තොරතුරු ඇතුලත් කොට නැවත නිර්මාණය කරමින් පවතී.
- අපගේ උපාධිදාරීන් අතර ව්‍යවසායකත්ව සංස්කෘතියක් ඇති කිරීම සඳහා පාඨමාලා හා පුහුණු ලබා දීමට මධ්‍යස්ථාන සහ ඒකක ස්ථාපනය කිරීම. උදාහරණ: QIG හි ප්‍රතිපාදනය මගින් රැකියා විරහිත උපාධිධාරීන්, රැකියා නිර්මාණකරුවන් බවට පත්කිරීම සඳහා "සේවා නියුක්තබව සහ ව්‍යවසායකත්ව නිපුණතා වර්ධනය කිරීමේ මධ්‍යස්ථානය" පිහිටුවීමට ක්‍රියාමාර්ග ගෙන ඇත.
- වර්තමානයේ සම්බන්ධතා පවත්වාගෙන යන ආයතන වන ඉන්දීය අන්නාමලෙයි විශ්වවිද්‍යාලය, ඉන්දීය ශ්‍රී රාම් කළමනාකරණ ආයතනය සහ ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයට අමතරව දේශීය හා විදේශීය විශ්වවිද්‍යාල සහ පර්යේෂණ ආයතන සමඟ සම්බන්දතා ඇති කිරීම.
- මඩකලපුව බුද්ධිමත් නගරයක් වශයෙන් බිහිකිරීමේ අභිමාර්ථය සමග වෘත්තිමය නිපුණතා සහ දැනුම වර්ධනය කිරීම තුලින් තම වෘත්තීය තත්ත්වය දියුණු කිරීම මෙන්ම ජාතික ආර්ථිකයට දායකත්වය ලබාදිය හැකි ආකාරයට ස්වයං මූල්‍ය පාඨමාලා වැඩි වශයෙන් ප්‍රජාවට හඳුන්වා දීම.
- විදේශ ශිෂ්‍යයන් දිරි ගැන්වීම තුලින් සෞඛ්‍ය ආරක්ෂණ විද්‍යා පීඨය තෝරා ගැනීම අවස්ථාව ලබා දීම සහ අපගේ ශිෂ්‍යයන් විදේශ ආයතනවලට යැවීමට උත්සාහ කිරීම. මේ සඳහා එක්සත් රාජධානියේ ශිෂ්‍යයන් කීප දෙනෙක් තමන්ගේ කැමැත්ත පලකර ඇත.
- සියලුම පීඨවල විෂය නිර්දේශයන් සඳහා වැඩිපුර තොරතුරු තාක්ෂණ සහ ඉංග්‍රීසි විෂයන් ඇතුලත් කිරීම. භාෂා පර්යේෂණාගාර පහසුකම් සහ ස්වයං අධ්‍යයන මධ්‍යස්ථාන පිහිටුවීම තුලින් අපගේ උපාධිධාරීන්ට අවශ්‍ය සන්නිවේදන සහ තොරතුරු තාක්ෂණ නිපුණතා සංවර්ධනය කර ඔවුන් සේවා නියුක්තිකයන් බවට පත්කිරීම.
- මත් ද්‍රව්‍ය භාවිතය, ළමා අපචාර, ඩෙංගු අවධානම වැනි සමාජයේ මතුවන ගැටළු සම්බන්ධ දැනුවත් කිරීම සහ මේ සම්බන්ධ පර්යේෂණයන් දිරි ගැන්වීම.
- පහත ව්‍යාපෘති මේ වන විට ක්‍රියාත්මක වෙමින් පවතී.

- මඩකලපුව දිස්ත්‍රික්කයේ සිටින වැඩිහිටියන්ගේ සෞඛ්‍ය ආරක්ෂණ පහසුකම්වල ගුණාත්මකභාවය වර්ධනය කිරීම.
- ප්‍රදර්ශන මාලා, නිරූපන සහ වීදි නාට්‍යය මගින් දේශීය සංස්කෘතිය සහ දේශීය ආර්ථිකය යනාදිය ආරක්ෂා කිරීමට කටයුතු කිරීම.
- සෞඛ්‍ය ආරක්ෂණ විද්‍යා පීඨ ශිෂ්‍යයන් සඳහා "සාම වෛද්‍යකර්ම" අධ්‍යයන වැඩසටහන හඳුන්වා දීම.
- නව පීඨ බිහි කිරීම සහ නව පාඨමාලා හඳුන්වා දීම තුලින් ජාත්‍යන්තර වශයෙන් සේවා නියුක්ත හැකියාවැති උපාධිධාරීන් සහ ජාතියේ විශිෂ්ඨ පුරවැසියන් බවට පත්කිරීම. "ගමනාගමන, සංචාරක හා අගන්තුක සත්කාර පීඨය", "හින්දු ශිෂ්ඨාචාර පීඨය" සහ ඖෂධවේදී උපාධි, පෙර පාසල් හා ප්‍රථමික අධ්‍යාපන අධ්‍යාපනවේදී උපාධි පාඨමාලා හඳුන්වා දීමට පියවර ගෙන ඇත.
- වාණිජ්‍ය හා කළමනාකරණ පීඨයෙහි පවතින වැඩසටහන් වලට අමතරව සෑම පීඨයෙහිම අවසන් වසර ශිෂ්‍යයන් සඳහා රැකියා අවස්ථා සහ කර්මාන්ත පුහුණු වැඩසටහන් හඳුන්වා දී පෞද්ගලික අංශයෙහි ඔවුන්ගේ දක්ෂතා දැක්වීම තුලින් රැකියා අවස්ථාවන් වර්ධනය කිරීම.
- "සේවා නියුක්ති සහ ව්‍යවසායකත්ව නිපුණතා වර්ධනය කිරීමේ මධ්‍යස්ථානය" පිහිටුවීම.
- සන්නිවේදන නිපුණතා වර්ධනය කර, ඒ තුලින් සමාජ එකමුතුකම ඇතිකිරීම සඳහා භාෂා පර්යේෂණාගාරයක් පිහිටුවනු ලැබේ.
- සියලු දෙනාටම සන්නිවේදන සහ තොරතුරු තාක්ෂණ දැනුම ලබා දීම සඳහා සන්නිවේදන සහ තොරතුරු තාක්ෂණ මධ්‍යස්ථාන ශක්තිමත් කිරීම.
- ඖෂධවේදී උපාධි පාඨමාලාව හඳුන්වා දීම.

4. සම්පත් සහ ශිෂ්‍යයන් පිළිබඳ තොරතුරු

පීඨය	පාඨමාලාව	මුළු ශිෂ්‍යය සංඛ්‍යාව	මුළු අධ්‍යයන කාර්ය මණ්ඩල සංඛ්‍යාව	මුළු අනධ්‍යයන කාර්ය මණ්ඩල සංඛ්‍යාව
ශ්‍රී ලං.නැ.වි.වි.				
කලා හා සංස්කෘත	කලා හා සංස්කෘත උපාධිය	1220	53	20
කෘෂිකර්මය	කෘෂිකර්ම විද්‍යාවේදී උපාධිය	175	27	36
වාණිජ හා කළමනාකරණය	ව්‍යාපාර පරිපාලනවේදී උපාධිය	324	24	14
	වාණිජවේදී උපාධිය	318		
සෞඛ්‍ය ආරක්ෂණ විද්‍යා පීඨය	වෛද්‍ය උපාධිය	265	22	29
	හෙද උපාධිය	45	04	
විද්‍යාව	විද්‍යාවේදී උපාධිය (ජීව විද්‍යාව)	188	32	37
	විද්‍යාවේදී උපාධිය (භෞතික විද්‍යාව)	234		
එකතුව		**2769**	**162**	**136**
ත්‍රිකුණාමල මණ්ඩපය				
සන්නිවේදන සහ ව්‍යාපාර අධ්‍යයන පීඨය	කළමනාකරණ විද්‍යාවේදී උපාධිය	219	05	01
	සන්නිවේදන විද්‍යාවේදී උපාධිය	242	06	-
ව්‍යවහාර විද්‍යා පීඨය	පරිගණක විද්‍යා උපාධිය	10	05	01
දේශීය සිද්ධ වෛද්‍ය ඒකකය	සිද්ධ වෛද්‍ය හා ශල්‍ය වෛද්‍ය උපාධිය	60	05	04
එකතුව		**531**	**21**	**06**

5. දේශීය ශිෂ්‍යයන් පිළිබඳ තොරතුරු:

පීඨය	පාඨමාලාව	මාධ්‍යය	2012 ඇතුළත්වීම	1 වන වසර ශිෂ්‍යයන්	2 වන වසර ශිෂ්‍යයන්	3 වන වසර ශිෂ්‍යයන්	4 වන වසර ශිෂ්‍යයන්	5 වන වසර ශිෂ්‍යයන්	උපාධිධාරීන් සංඛ්‍යාව
ශ්‍රී ලං.නැ.වි.වි.									
කලා හා සංස්කෘත	කලා හා සංස්කෘත උපාධිය	දෙමළ	-	261	253	338	368	-	340
කෘෂිකර්මය	කෘෂිකර්ම විද්‍යාවේදී උපාධිය	ඉංග්‍රීසි	-	73	42	36	24	-	27
වාණිජ හා කළමනාකරණය	ව්‍යාපාර පරිපාලනවේදී උපාධිය	ඉංග්‍රීසි	-	105	88	79	52	-	91
	වාණිජවේදී උපාධිය	ඉංග්‍රීසි	-	94	75	135	14	-	
සෞඛ්‍ය ආරක්ෂණ විද්‍යා පීඨය	වෛද්‍ය උපාධිය	ඉංග්‍රීසි	-	50	51	66	35	63	27
	හෙද උපාධිය	ඉංග්‍රීසි	-	26	09	05	04	-	-
විද්‍යාව	විද්‍යාවේදී උපාධිය (ජීව විද්‍යාව)	ඉංග්‍රීසි	-	114	38	17	19	-	16
	විද්‍යාවේදී උපාධිය (භෞතික විද්‍යාව)	ඉංග්‍රීසි	-	133	49	20	32	-	
එකතුව			**-**	**856**	**605**	**696**	**549**	**63**	**501**
ත්‍රිකුණාමල මණ්ඩපය									
සන්නිවේදන සහ ව්‍යාපාර අධ්‍යයන පීඨය	කළමනාකරණ විද්‍යාවේදී උපාධිය	ඉංග්‍රීසි	-	51	50	58	17	-	28
	සන්නිවේදන විද්‍යාවේදී උපාධිය	ඉංග්‍රීසි	-	51	57	46	15	-	76
ව්‍යවහාර විද්‍යා පීඨය	පරිගණක විද්‍යා උපාධිය	ඉංග්‍රීසි	-	-	-	10	-	-	-
දේශීය සිද්ධ වෛද්‍ය ඒකකය	සිද්ධ වෛද්‍ය හා ශල්‍ය වෛද්‍ය උපාධිය	ඉංග්‍රීසි	-	11	16	19	-	-	-
එකතුව			**-**	**113**	**123**	**133**	**32**	**-**	**104**

6. අධ්‍යයන කාර්ය මණ්ඩල තොරතුරු:

අ. ශ්‍රී ලං.නැ.වි.වි.

පීඨය	විෂයයන්	මාධ්‍යය	ජ්‍යෙෂ්ඨ මහාචාර්යය	මහාචාර්යය	ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය/ කථිකාචාර්ය (තාවකාලික)	උපදේශක/ බාහිර කාර්ය මණ්ඩල
කලා හා සංස්කෘත	අරාබි, ලලිත කලා, නාට්‍ය හා රංගකලාව, භූගෝල විද්‍යාව, දෙමළ, තුලනාත්මක ආගම්, ක්‍රිස්තියානි, අධ්‍යාපන, ඉස්ලාම් අධ්‍යයනය, හින්දු ශිෂ්ටාචාරය, ඉතිහාසය, ආර්ථික විද්‍යාව, සමාජ විද්‍යාව, දර්ශනය, දේශපාලන විද්‍යාව	දෙමළ / ඉංග්‍රීසි	-	01	39	11
කෘෂිකර්මය	කෘෂි ජීව විද්‍යා, කෘෂි රසායන විද්‍යා, කෘෂි ආර්ථික විද්‍යා, කෘෂි ඉංජිනේරු, සත්ත්ව විද්‍යා, භෝග විද්‍යා	ඉංග්‍රීසි	0	0	21	04
වාණිජ හා කළමනාකරණය	වාණිජ්‍යය, කළමනාකරණය, ආර්ථික විද්‍යාව, මානව සම්පත් කළමනාකරණය, අලෙවිකරණය, ව්‍යවසාය සංවර්ධනය, ගණකාධිකරණ සහ මූල්‍ය , ව්‍යාපාර ආර්ථික විද්‍යාව, සංවර්ධන ආර්ථික විද්‍යාව	ඉංග්‍රීසි	0	0	22	14
විද්‍යා	උද්භිද විද්‍යා, රසායන විද්‍යා, සත්ත්ව විද්‍යා, භෞතික විද්‍යා, ගණිතය, පරිගණක විද්‍යා	ඉංග්‍රීසි	0	0	25	15
සෞඛ්‍ය ආරක්ෂණ විද්‍යා	මානව ජීව විද්‍යාව, ව්‍යාධි භෞතිකවේදී, සායන විද්‍යා, ප්‍රාථමික සෞඛ්‍ය ආරක්ෂණ, වෛද්‍ය විද්‍යා අධ්‍යාපන හා පර්යේෂණ, අතිරේක සෞඛ්‍ය විද්‍යා	ඉංග්‍රීසි	0	01	21	42
එකතුව			**0**	**02**	**128**	**86**

ආ. ත්‍රිකුණාමල මණ්ඩපය

පීඨයන්	විෂයයන්	මාධ්‍යය	ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය/ කථිකාචාර්ය (තාවකාලික	උපදේශක/ බාහිර කාර්ය මණ්ඩල
සන්නිවේදන සහ ව්‍යාපාර අධ්‍යයන පීඨය	කළමනාකරණ	ඉංග්‍රීසි	05	-
	සන්නිවේදනය	ඉංග්‍රීසි	06	-
ව්‍යාවහාර විද්‍යා පීඨය	පරිගණක විද්‍යාව	ඉංග්‍රීසි	05	-
	භෞතික විද්‍යා	ඉංග්‍රීසි		-
දේශීය සිද්ධ වෛද්‍ය ඒකකය	-	ඉංග්‍රීසි	05	-
එකතුව			**21**	**-**

7. අනධ්‍යයන කාර්ය මණ්ඩල තොරතුරු:

අ. ශ්‍රී ලං.නැ.වි.වි.

පීඨයන්/අධ්‍යයනාංශයන්/ අංශයයන් / ශාඛාවන්/ ඒකකයන්	ජ්‍යෙෂ්ඨතම [1]	ජ්‍යෙෂ්ඨ කාර්ය මණ්ඩලය [2]	කණිෂ්ඨ කාර්ය මණ්ඩලය [3]	සුළු සේවකයන් [4]
උපකුලපති කාර්යාලය, උපකුලපති නවාතැන	1	1	2	1
ලේඛකාධිකාරි කාර්යාලය	1	-	2	1
සනාථන සභාව	-	1	2	1
පරිපාලන ශාඛාව	1	-	20	-
අභ්‍යන්තර විගණන ඒකකය	1	1	1	1
වෘත්තීය මාර්ගෝපදේශ ඒකකය	-	-	1	-
අනධ්‍යයන / ආයතන ශාඛාව	1	-	3	-
අධ්‍යයන/ ආයතන ශාඛාව	1	-	5	1
සැපයීම් ශාඛාව	1	-	7	2
මූල්‍යාධිකාරි කාර්යාලය	3	4	3	1
කෘෂි පීඨය	1	3	15	13
වාණිජ්‍ය හා කළමනාකරණ පීඨය	1	-	7	6
විද්‍යා පීඨය	1	9	10	10
සෞඛ්‍ය ආරක්ෂණ විද්‍යා පීඨය	1	1	20	9
කලා හා සංස්කෘත පීඨය	1	4	10	6
තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ මධ්‍යස්ථානය	-	-	2	1
ඉංග්‍රීසි භාෂා ඉගැන්වීමේ ඒකකය	-	-	-	1
විභාග ශාඛාව	1	2	9	2
බාහිර උපාධි පාඨමාලා මධ්‍යස්ථානය	-	1	3	1
පුස්තකාලය	-	-	8	1
සෞඛ්‍ය මධ්‍යස්ථානය	1	-	7	-
ශාරීරික විද්‍යා අධ්‍යාපනය	-	-	2	1
සුභසාධන ශාඛාව	1	-	2	1
නඩත්තු අංශය	1	-	9	16
නේවාසිකාගාර	-	-	9	1
ආරක්ෂක කාර්යාලය	1	2	15	-
එකතුව	**20**	**29**	**174**	**77**

1 - Administrative level & Executive Level   2 - Senior Staff Grade
3 - Clerical & Allied Grade   4 - Below the above Grade

ආ. ත්‍රිකුණාමල මණ්ඩපය

පීඨයන්/අධ්‍යයනාංශයන්/ අංශයයන් / ශාඛාවන්/ ඒකකයන්	ජ්‍යෙෂ්ඨතම	ජ්‍යෙෂ්ඨ කාර්ය මණ්ඩලය	කණිෂ්ඨ කාර්ය මණ්ඩලය	සුළු සේවකයන්
සාමාන්‍ය පරිපාලනය	01	07	03	-
නඩත්තු	-	-	02	-
විභාග ශාඛාව	-	01	01	01
ආයතන ශාඛාව	-	01	-	-
සුභසාධන ශාඛාව	01	01	-	-
මූල්‍ය ශාඛාව	02	04	01	01
පුස්තකාලය	-	04	01	-
ව්‍යාපාර හා කළමනාකරණ අධ්‍යයන අධ්‍යයනාංශය	-	-	-	01
භාෂා හා සන්නිවේදන අධ්‍යයන අධ්‍යයනාංශය	-	-	-	-
ව්‍යවහාරික විද්‍යා පීඨය	-	-	01	01
සිද්ධ වෛද්‍ය ඒකකය	-	-	01	02
එකතුව	**04**	**18**	**10**	**06**

8. පර්යේෂණ, නවෝත්පාදන සහ ප්‍රකාශන පිළිබඳ තොරතුරු:

අ. ශ්‍රී.ල.නැ.වි.වි

1. කෘෂි පීඨය			
විෂය	**ප්‍රකාශයට පත් කළ**	**අලෙවි කළ**	**ඉදිරිපත් කළ**
අ. පර්යේෂණ සංඛ්‍යාව	44	-	27
ආ. නවෝත්පාදන සංඛ්‍යාව	01	-	-
ඇ. සඟරා සංඛ්‍යාව	14	-	02
ඈ. පොත් සංඛ්‍යාව	06	08	01
ඉ. ලිපි සංඛ්‍යාව	12	-	11
ඊ. වෙනත්	-	-	-
එකතුව	**77**	**08**	**41**
2. කලා හා සංස්කෘත පීඨය			
විෂය	**ප්‍රකාශයට පත් කළ**	**අලෙවි කළ**	**ඉදිරිපත් කළ**
අ. පර්යේෂණ සංඛ්‍යාව	18	-	-
ආ. නවෝත්පාදන සංඛ්‍යාව	-	-	-
ඇ. සඟරා සංඛ්‍යාව	-	-	-
ඈ. පොත් සංඛ්‍යාව	05	-	-
ඉ. ලිපි සංඛ්‍යාව	32	-	-
ඊ. වෙනත්	-	-	-
එකතුව	**55**	**-**	**-**
3. වාණිජ්‍ය හා කළමනාකරණ පීඨය			
විෂය	**ප්‍රකාශයට පත් කළ**	**අලෙවි කළ**	**ඉදිරිපත් කළ**
අ. පර්යේෂණ සංඛ්‍යාව	05	-	09
ආ. නවෝත්පාදන සංඛ්‍යාව	-	-	-
ඇ. සඟරා සංඛ්‍යාව	-	-	01
ඈ. පොත් සංඛ්‍යාව	03	-	-
ඉ. ලිපි සංඛ්‍යාව	02	02	-
ඊ. වෙනත්	01	-	-
එකතුව	**11**	**02**	**10**

4. සෞඛ්‍ය හා ආරක්ෂණ විද්‍යා පීඨය			
විෂය	**ප්‍රකාශයට පත් කළ**	**අලෙවි කළ**	**ඉදිරිපත් කළ**
අ. පර්යේෂණ සංඛ්‍යාව	-	-	03
ආ. නවෝත්පාදන සංඛ්‍යාව	-	-	-
ඇ. සඟරා සංඛ්‍යාව	-	-	-
ඈ. පොත් සංඛ්‍යාව	-	-	-
ඉ. ලිපි සංඛ්‍යාව	-	-	-
ඊ. වෙනත්	-	-	-
එකතුව	**-**	**-**	**03**
5. විද්‍යා පීඨය			
විෂය	**ප්‍රකාශයට පත් කළ**	**අලෙවි කළ**	**ඉදිරිපත් කළ**
අ. පර්යේෂණ සංඛ්‍යාව	66	01	31
ආ. නවෝත්පාදන සංඛ්‍යාව	-	-	-
ඇ. සඟරා සංඛ්‍යාව	-	-	-
ඈ. පොත් සංඛ්‍යාව	03	-	-
ඉ. ලිපි සංඛ්‍යාව	-	-	-
ඊ. වෙනත්	-	-	-
එකතුව	**69**	**01**	**31**

ආ. ත්‍රිකුණාමල මණ්ඩපය

විෂය	ප්‍රකාශයට පත් කළ	අලෙවි කළ	ඉදිරිපත් කළ
අ. පර්යේෂණ සංඛ්‍යාව	-	-	03
ආ. නවෝත්පාදන සංඛ්‍යාව	-	-	-
ඇ. සඟරා සංඛ්‍යාව	-	-	-
ඈ. පොත් සංඛ්‍යාව	-	-	-
ඉ. ලිපි සංඛ්‍යාව	-	-	-
ඊ. වෙනත්	-	-	01
එකතුව	**-**	**-**	**04**

9. වැඩසටහන්, සම්මන්ත්‍රණ හා වැඩමුළු විස්තර

අ. ශ්‍රී.ල.නැ.වි.වි

1. කෘෂි පීඨය			
විෂය	**සහභාගී වන ලද**	**සම්පූර්ණ කරන ලද**	**ඉදිරිපත් කරන ලද**
අ. පශ්චාත් උපාධි පාඨමාලා සංඛ්‍යාව	04	04	01
ආ. පශ්චාත් උපාධි ඩිප්ලෝමා පාඨමාලා සංඛ්‍යාව	-	-	-
ඇ. උපාධි පාඨමාලා සංඛ්‍යාව	01	01	-
ඈ. ඩිප්ලෝමා පාඨමාලා සංඛ්‍යාව	-	-	-
ඉ. සහතිකපත්‍ර පාඨමාලා සංඛ්‍යාව	28	02	02
ඊ. වෙනත්	22	-	05
එකතුව	**55**	**07**	**08**
2. කලා හා සංස්කෘත පීඨය			
විෂය	**සහභාගී වන ලද**	**සම්පූර්ණ කරන ලද**	**ඉදිරිපත් කරන ලද**
අ. පශ්චාත් උපාධි පාඨමාලා සංඛ්‍යාව	16	01	01
ආ. පශ්චාත් උපාධි ඩිප්ලෝමා පාඨමාලා සංඛ්‍යාව	-	-	-
ඇ. උපාධි පාඨමාලා සංඛ්‍යාව	-	-	-
ඈ. ඩිප්ලෝමා පාඨමාලා සංඛ්‍යාව	-	-	-
ඉ. සහතිකපත්‍ර පාඨමාලා සංඛ්‍යාව	02	01	-
ඊ. වෙනත්	21	06	08
එකතුව	**38**	**08**	**09**

3. වාණිජ්‍යය හා කළමනාකරණ පීඨය			
විෂය	**සහභාගී වන ලද**	**සම්පූර්ණ කරන ලද**	**ඉදිරිපත් කරන ලද**
අ. පශ්චාත් උපාධි පාඨමාලා සංඛ්‍යාව	03	01	-
ආ. පශ්චාත් උපාධි ඩිප්ලෝමා පාඨමාලා සංඛ්‍යාව	-	-	-
ඇ. උපාධි පාඨමාලා සංඛ්‍යාව	-	-	-
ඈ. ඩිප්ලෝමා පාඨමාලා සංඛ්‍යාව	-	-	-
ඉ. සහතිකපත්‍ර පාඨමාලා සංඛ්‍යාව	03	-	-
ඊ. වෙනත්	16	11	01
එකතුව	**22**	**12**	**01**

4. සෞඛ්‍ය හා ආරක්ෂණ විද්‍යා පීඨය			
විෂය	**සහභාගී වන ලද**	**සම්පූර්ණ කරන ලද**	**ඉදිරිපත් කරන ලද**
අ. පශ්චාත් උපාධි පාඨමාලා සංඛ්‍යාව	-	01	01
ආ. පශ්චාත් උපාධි ඩිප්ලෝමා පාඨමාලා සංඛ්‍යාව	01	01	-
ඇ. උපාධි පාඨමාලා සංඛ්‍යාව	-	-	-
ඈ. ඩිප්ලෝමා පාඨමාලා සංඛ්‍යාව	-	-	-
ඉ. සහතිකපත්‍ර පාඨමාලා සංඛ්‍යාව	06	11	-
ඊ. වෙනත් (සම්මන්ත්‍රණ සහ වැඩමුළු)	09	06	02
එකතුව	**16**	**19**	**03**

5. විද්‍යා පීඨය			
විෂය	**සහභාගී වන ලද**	**සම්පූර්ණ කරන ලද**	**ඉදිරිපත් කරන ලද**
අ. පශ්චාත් උපාධි පාඨමාලා සංඛ්‍යාව	02	01	01
ආ. පශ්චාත් උපාධි ඩිප්ලෝමා පාඨමාලා සංඛ්‍යාව	-	-	-
ඇ. උපාධි පාඨමාලා සංඛ්‍යාව	-	-	-
ඈ. ඩිප්ලෝමා පාඨමාලා සංඛ්‍යාව	03	02	01
ඉ. සහතිකපත්‍ර පාඨමාලා සංඛ්‍යාව	-	-	-
ඊ. වෙනත්	-	-	-
එකතුව	**05**	**03**	**02**

ආ. ත්‍රිකුණාමල මණ්ඩපය

විෂය	**සහභාගී වන ලද**	**සම්පූර්ණ කරන ලද**	**ඉදිරිපත් කරන ලද**
අ. පශ්චාත් උපාධි පාඨමාලා සංඛ්‍යාව	04	03	02
ආ. පශ්චාත් උපාධි ඩිප්ලෝමා පාඨමාලා සංඛ්‍යාව	-	-	-
ඇ. උපාධි පාඨමාලා සංඛ්‍යාව	-	-	-
ඈ. ඩිප්ලෝමා පාඨමාලා සංඛ්‍යාව	-	-	-
ඉ. සහතිකපත්‍ර පාඨමාලා සංඛ්‍යාව	-	-	-
ඊ. වෙනත්	-	-	-
එකතුව	**04**	**03**	**02**

10. ප්‍රදාන ලැබීම් පිළිබඳ තොරතුරු:

අ. ශ්‍රී ලං.නැ.වි.වි.

1. කෘෂි විද්‍යා පීඨය			
විෂය	**ප්‍රදානයන් සංඛ්‍යාව**	**අනධ්‍යයන කාර්ය මණ්ඩල සංඛ්‍යාව**	**ශිෂ්‍ය සංඛ්‍යාව**
අ. දේශීය ප්‍රදාන	04	02	-
ආ. ජාතික ප්‍රදාන	-	-	-
ඇ. අන්තර්ජාතික ප්‍රදාන	-	-	-
ඈ. වෙනත්	-	-	-
එකතුව	**04**	**02**	**-**

2. කලා හා සංස්කෘත පීඨය			
විෂය	ප්‍රදානයන් සංඛ්‍යාව	අනධ්‍යයන කාර්ය මණ්ඩල සංඛ්‍යාව	ශිෂ්‍ය සංඛ්‍යාව
අ. දේශීය ප්‍රදාන	01	-	-
ආ. ජාතික ප්‍රදාන	01	01	-
ඇ. අන්තර්ජාතික ප්‍රදාන	-	-	-
ඈ. වෙනත්	-	-	-
එකතුව	**02**	**01**	**-**

3. වාණිජ්‍යය හා කළමනාකරණ පීඨය			
විෂය	ප්‍රදානයන් සංඛ්‍යාව	අනධ්‍යයන කාර්ය මණ්ඩල සංඛ්‍යාව	ශිෂ්‍ය සංඛ්‍යාව
අ. දේශීය ප්‍රදාන	01	-	-
ආ. ජාතික ප්‍රදාන	-	-	-
ඇ. අන්තර්ජාතික ප්‍රදාන	-	-	-
ඈ. වෙනත්	-	-	-
එකතුව	**01**	**-**	**-**

4. සෞඛ්‍ය ආරක්ෂණ විද්‍යා පීඨය			
විෂය	ප්‍රදානයන් සංඛ්‍යාව	අනධ්‍යයන කාර්ය මණ්ඩල සංඛ්‍යාව	ශිෂ්‍ය සංඛ්‍යාව
අ. දේශීය ප්‍රදාන	-	-	-
ආ. ජාතික ප්‍රදාන	-	-	-
ඇ. අන්තර්ජාතික ප්‍රදාන	01	01	-
ඈ. වෙනත්	-	-	-
එකතුව	**01**	**01**	**-**
5. විද්‍යා පීඨය - නැත			

ආ. ත්‍රිකුණාමල මණ්ඩපය

විෂය	ප්‍රදානයන් සංඛ්‍යාව	අනධ්‍යයන කාර්ය මණ්ඩල සංඛ්‍යාව	ශිෂ්‍ය සංඛ්‍යාව
අ. දේශීය ප්‍රදාන	-	-	-
ආ. ජාතික ප්‍රදාන	-	-	-
ඇ. අන්තර්ජාතික ප්‍රදාන	01	-	01
ඈ. වෙනත්	-	-	-
එකතුව	**01**	**-**	**01**

11. ආරම්භ කරන ලද නව පාඨමාලා පිළිබඳ විස්තර:

අ. ශ්‍රී ලං.නැ.වි.වි.

පීඨය	පාඨමාලාව	මාධ්‍යය	විද්‍යාපති උපාධි
1. විද්‍යා පීඨය	විද්‍යා අධ්‍යාපනය පිළිබඳ විද්‍යාපති උපාධිය	ඉංග්‍රීසි	01
එකතුව			**01**

12. පුනරාවර්තන වියදම් විස්තර

අ. ශ්‍රී ලං.නැ.වි.වි.

විෂයය	2011 (රු:)	2012 (රු:)
අ. පෞද්ගලික සංවේතන	278,295,941.69	314,543,938.91
ආ. ගමන් වියදම්	1,324,620.30	1,173,847.69
ඇ. සැපයුම්	20,538,845.73	23,681,136.36
ඈ. නඩත්තු	8,506,836.13	9,872,207.49
ඉ.ගිවිසුම්මය සේවා	48,786,417.51	61,387,309.09
ඊ.වෙනත්	10,544,669.74	16,428,218.96
එකතුව	**367,997,331.10**	**427,086,658.50**

ආ. ත්‍රිකුණාමල මණ්ඩපය

විෂයය	2011 (රු:)	2012 (රු:)
අ. පෞද්ගලික සංවේතන	33,554,885.25	44,844,297.35
ආ. ගමන්වියදම්	267,113.78	205,965.28
ඇ. සැපයුම්	4,262,968.12	6,312,522.67
ඈ. නඩත්තු	2,413,526.93	2,924,883.12
ඉ.ගිවිසුම්මය සේවා	27,394,627.28	38,192,975.88
ඊ.වෙනත්	1,692,524.28	3,231,742.74
එකතුව	**69,585,645.64**	**95,712,387.04**

13. ප්‍රාග්ධන වියදම් විස්තර:

අ. ශ්‍රී ලං.නැ.වි.වි.

විෂයය	2011 (රු:)	2012 (රු:)
අ. ලී බඩු හා කාර්යාලීය උපකරණ අත්පත් කර ගැනීම	14,230,524.46	24,972,730.64
ආ. යන්ත්‍රෝපකරණ අත්පත් කර ගැනීම	-	-
ඇ. ගොඩනැගිලි හා ආකෘති අත්පත් කර ගැනීම*	9,815,888.46	261,251,304.74
ඈ. වෙනත්	49,872,259.13	77,839,425.35
එකතුව	**73,918,672.05**	**364,063,460.73**

* - Construction Project

ආ. ත්‍රිකුණාමල මණ්ඩපය

විෂයය	2011 (රු:)	2012 (රු:)
අ. ලී බඩු හා කාර්යාලීය උපකරණ අත්පත් කර ගැනීම	1,207,770.50	8,401,209.40
ආ. යන්ත්‍රෝපකරණ අත්පත් කර ගැනීම	-	-
ඇ. ගොඩනැගිලි හා ආකෘති අත්පත් කර ගැනීම	5,260,250.04	16,021,520.16
ඈ. වෙනත්	809,916.55	7,479,282.66
එකතුව	**7,277,937.09**	**31,902,012.22**

14. ව්‍යාපෘති විස්තර (දේශීය/විදේශීය ආධාර):

අ. ත්‍රිකුණාමල මණ්ඩපය

නම සහ විස්තර	ණය/ ප්‍රදාන	අරමුදල් සම්පාදිත නියෝජිතායතනය #	සමස්ත පිරිවැය ඇස්තමේන්තුව (රු:)	පර්යේෂණ අරමුදල් ප්‍රමාණය (රු:)	ප්‍රදාන අරමුදල් (රු:)
පිරිමි හා ගැහැණු වැසිකිලි කොරිඩො (පටු ආලින්දය) නැවත පිලිසකර කිරීම	ප්‍රදාන	ශ්‍රී ලංකා රජය	659,827.50	-	-
රථ ගාල	ප්‍රදාන	ශ්‍රී ලංකා රජය	2,347,070.00	-	-
සිද්ධා වෛද්‍ය ඒකකයේ සත්ත්ව නිවහන සඳහා පර්යේෂණාගාරය ඉදිකිරීම	ප්‍රදාන	ශ්‍රී ලංකා රජය	3,590,140.30	-	-
LCS හි නැරඹුම් මැදිරිය වැඩි දියුණු කිරීම	ප්‍රදාන	ශ්‍රී ලංකා රජය	1,133,150.00	-	-
ත්‍රිකුණාමලය, සෙල්වනායහපුරම්, සාන්ත අන්තෝනි වීදිය, අංක 526 හි පිරිමි නේවාසිකාගාරය සඳහා ඇස්තමේන්තුව සැකසීම	ප්‍රදාන	ශ්‍රී ලංකා රජය	99,315.00	-	-
පංති කාමර ගොඩනැගිල්ල වැඩි දියුණු කිරීම - 3	ප්‍රදාන	ශ්‍රී ලංකා රජය	863,615.00	-	-
පංති කාමර ගොඩනැගිල්ල වැඩි දියුණු කිරීම - 2	ප්‍රදාන	ශ්‍රී ලංකා රජය	786,155.00	-	-
පංති කාමර ගොඩනැගිල්ල වැඩි දියුණු කිරීම - 1	ප්‍රදාන	ශ්‍රී ලංකා රජය	1,059,285.00	-	-
ත්‍රිකුණාමලය නැව්තටාංගනය පාර 315 හි පිරිමි නේවාසිකාගාරය සඳහා වැසිකිලි 05ක් හා නාන කාමර 05ක් නැවත පිලිසකර කිරීම	ප්‍රදාන	ශ්‍රී ලංකා රජය	1,453,043.40	-	-
BMS සඳහා කාර්යාලය හා දේශන ශාලාව නැවත පිලිසකර කිරීම	ප්‍රදාන	ශ්‍රී ලංකා රජය	2,368,395.00	-	-
පුස්ථකාලය ජාලගත කිරීම සඳහා කොටස් කිරීමේ වැඩ සහ මූල්‍ය හා පරිගණක ඒකක වහලය සඳහා ආමොනො තහඩු යෙදීම.	ප්‍රදාන	ශ්‍රී ලංකා රජය	761,900.00	-	-
BMS දෙපාර්තමේන්තුව සඳහා දේශන ශාලාව ඉදිකිරීම.	ප්‍රදාන	ශ්‍රී ලංකා රජය	3,519,140.30	-	-
පිරිමි නේවාසිකාගාරය ඉදිකිරීම.	ප්‍රදාන	ශ්‍රී ලංකා රජය	100,000,000.00	-	-
ගැහැණු නේවාසිකාගාරය ඉදිකිරීම.	ප්‍රදාන	ශ්‍රී ලංකා රජය	100,000,000.00	-	-
එකතුව			**218,641,036.50**	**-**	**-**

(ශ්‍රී ලංකා රජය / ආසියානු සංවර්ධන බැංකුව / අන්තර්ජාතික සංවර්ධන සංගමය / ලෝක බැංකුව / ……….

15. ව්‍යාපෘති වියදම් විස්තර (දේශීය/විදේශීය ආධාර):

අ. ශ්‍රී ලං.නැ.වි.වි.

නම	සමස්ත පිරිවැය ඇස්තමේන්තුව (රු:)	2011 වර්ෂය තුළ වියදම (රු:)	2012 වර්ෂය තුළ වියදම (රු:)	2012.12.31 දිනට සමුච්චිත වියදම	භෞතික ප්‍රගතිය %
ගෘහස්ථ භූමි මැනීම	2,507,000.00	1,434,010.00	1,072,990.00	2,507,000.00	100
කාබනික ගොවිතැන	515,848.57	515,848.66		515,848.66	100
DTHR ව්‍යාපෘතිය	454,029.50	-	104,935.00	104,935.00	23
DFC ව්‍යාපෘතිය	641,296.00	-	95,000.00	95,000.00	15
ජාතික කෘෂිකර්ම පර්යේෂණ සැලසුම (CARP)	31,465.20	-	31,465.20	31,465.20	100
GIS පුහුණු වැඩසටහන	63,000.00	-	63,000.00	63,000.00	100
WASH සමීක්ෂණ වැඩසටහන	4,746,500.00	-	1,827,700.00	1,827,700.00	39
තෝරා ගත් භූගොලීය හා පරිපාලන ස්ථාන අධ්‍යයනය	1,548,040.00	-	1,548,040.00	1,548,040.00	100
Land O' Development Sri Lanka DEEP වැඩසටහන	1,259,500.00	-	1,259,500.00	1,259,500.00	100
නැගෙනහිර පළාතේ පරම්පරික ධිවර කටයුතු සංවර්ධනය	2,223,900.00	-	2,223,900.00	2,223,900.00	100
ගැටුම් සාමය හා සංවර්ධනය	308,052.50	-	308,052.50	308,052.50	100
	14,298,631.77	**1,949,858.66**	**8,534,582.70**	**10,484,441.36**	**79**

ආ. ත්‍රිකුණාමල මණ්ඩපය

නම	සමස්ත පිරිවැය ඇස්තමේන්තුව (රු:)	2011 වර්ෂය තුළ වියදම (රු:)	2012 වර්ෂය තුළ වියදම (රු:)	2012.12.31 දිනට සමුච්චිත වියදම	භෞතික ප්‍රගතිය %
රථ ගාල	2,347,070.00	10,050,286.00	6,147,600.00	-	-
සිද්ධා වෛද්‍ය ඒකකයේ සත්ත්ව නිවහන සඳහා පර්යේෂණාගාරය ඉදිකිරීම	3,590,140.30	-	1,605,000.00	-	-
පුස්තකාලය ජාලගත කිරීම සඳහා කොටස් කිරීමේ වැඩ සහ මුල්‍ය හා පරිගණක ඒකක වහලය සඳහා ආමොනො තහඩු යෙදීම.	761,900.00	-	1,605,000.00	-	-
BMS දෙපාර්තමේන්තුව සඳහා දේශන ශාලාව ඉදිකිරීම.	3,519,140.30	-	-	-	-
	10,218,250.60	**10,050,286.00**	**9,357,600.00**	**-**	**-**

16. මූලාා ප්‍රගතිය පිළිබඳ විස්තර (වියදම්):

අ. ශ්‍රී ලං.නැ.වි.වි.

විෂයය	2012 තුළ වෙන්කිරීම් (රු:)	2012 වර්ෂය තුළ වියදම (රු:)	ඉතිරිය /අතිරික්තය (රු:)
අ. ව්‍යාපෘති හැර පුනරාවර්තන	426,811,000.00	427,086,658.50	(275,658.50)
ආ. ව්‍යාපෘති හැර ප්‍රාග්ධන	265,000,000.00	364,063,460.73	(99,063,460.73)
ඇ.ව්‍යාපෘති - දේශීය අරමුදල් සම්පාදිත	14,298,631.77	8,534,582.70	5,764,049.07
ඇ.ව්‍යාපෘති - විදේශීය අරමුදල් සම්පාදිත	-	-	
එකතුව	**706,109,631.77**	**799,684,701.93**	**(93,575,070.16)**

ආ. ත්‍රිකුණාමල මණ්ඩපය

විෂයය	2012 තුළ වෙන්කිරීම් (රු:)	2012 වර්ෂය තුළ වියදම (රු:)	ඉතිරිය /අතිරික්තය (රු:)
අ. ව්‍යාපෘති හැර පුනරාවර්තන	89,400,000.00	95,712,387.00	(6,312,387.00)
ආ. ව්‍යාපෘති හැර ප්‍රාග්ධන	36,400,000.00	31,902,012.00	4,497,988.00
ඇ.ව්‍යාපෘති - දේශීය අරමුදල් සම්පාදිත	136,500,000.00	9,357,600.00	127,142,400.00
ඇ.ව්‍යාපෘති - විදේශීය අරමුදල් සම්පාදිත	-	-	-
එකතුව	**262,300,000.00**	**136,971,999.00**	**125,328,001.00**

17. මූලාා ප්‍රගතිය පිළිබඳ විස්තර (ආදායම් ජනිතවීම්):

අ. ශ්‍රී ලං.නැ.වි.වි.

ආදායම් මූලාශ්‍රය	2012 තුළ වෙන්කිරීම් (රු:)	2012 තුළ එක්රැස්කිරීම් (රු:)	හිඟය/අතිරික්තය (රු:)
උපාධි අපේක්ෂක අධ්‍යයනය	3,483,918.64	8,838,850.00	5,354,931.00
පශ්චාත් උපාධි අධ්‍යයනය	1,273,386.30	1,184,450.00	(88,936.30)
උපදේශන	-	-	-
වෙනත්	1,334,583.20	685,900.00	(648,683.20)
එකතුව	**6,091,888.14**	**10,709,200.00**	**4,617,311.86**

ආ. ත්‍රිකුණාමල මණ්ඩපය

ආදායම් මූලාශ්‍රය	2012 තුළ වෙන්කිරීම් (රු:)	2012 තුළ එක්රැස්කිරීම් (රු:)	හිඟය/අතිරික්තය (රු:)
උපාධි අපේක්ෂක අධ්‍යයනය	792,000.00	736,394.43	(55,605.57)
පශ්චාත් උපාධි අධ්‍යයනය	-	-	-
උපදේශනය	-	-	-
වෙනත්	114,000.00	101,394.43	(12,605.57)
එකතුව	**906,000.00**	**837,788.86**	**(68,211.14)**

18. මූල්‍ය ක්‍රියාකාරිත්වය විශ්ලේෂණය - 2012:

අ. ශ්‍රී ලං.නැ.වි.වි.

විෂයය	සූත්‍රය	එක් ශිෂ්‍යයෙක් සඳහා වියදම රු:
එක් ශිෂ්‍යයෙක් සඳහා පුනරාවර්තන වියදම (පුවි)	පුවි / ශිෂ්‍ය සංඛ්‍යාව	154,238.59
එක් ශිෂ්‍යයෙක් සඳහා ප්‍රාග්ධන වියදම (ප්‍රාවි)	ප්‍රාවි / ශිෂ්‍ය සංඛ්‍යාව	131,478.32
එකතුව		**285,716.91**

"

ආ. ත්‍රිකුණාමල මණ්ඩපය

විෂයය	සූත්‍රය	එක් ශිෂ්‍යයෙක් සඳහා වියදම රු:
එක් ශිෂ්‍යයෙක් සඳහා පුනරාවර්තන වියදම (පුවි)	පුවි / ශිෂ්‍ය සංඛ්‍යාව	195,331.40
එක් ශිෂ්‍යයෙක් සඳහා ප්‍රාග්ධන වියදම (ප්‍රාවි)	ප්‍රාවි / ශිෂ්‍ය සංඛ්‍යාව	65,106.15
එකතුව		**260,437.55**

19. වෙනත් තොරතුරු/මෙම වාර්තාවට අදාල කාර්යය සාධනය:

a. 2012 වසර තුල පැවැත්වූ විගණන කමිටු

අ. අංක	රැස්වීම් අංකය	දිනය
01	10th	09.03.2012
02	11th	12.05.2012
03	12th	30.06.2012
04	13th	25.07.2012
05	14th	28.08.2012
06	15th	24.09.2012
07	16th	22.10.2012
08	17th	28.11.2012
09	18th	30.12.2012

20. 2012 දෙසැම්බර් 31 වනදායින් අවසන් වූ වසර සඳහා ශ්‍රී ලංකා විශ්වවිද්‍යාලයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව විගණකාධිපති වාර්තාවට

විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
AUDITOR GENERAL'S DEPARTMENT

මගේ අංකය / எனதுஇல / My No.	ඊඩබ්/බීටී/බී/ඊයූඑස්එල්/එෆ්එස්/2012	මබේ අංකය / உமது இல / Your No.	
දිනය / திகதி / Date	2013 ජුනි 30 දින.		

උප කුලපති,
ශ්‍රී ලංකා නැගෙනහිර විශ්ව විද්‍යාලය.

ශ්‍රී ලංකා නැගෙනහිර විශ්ව විද්‍යාලයේ 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 108(2) වගන්තිය හා 1971 අංක 38 දරන මුදල් පනතේ 13(7)(අ) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව

ශ්‍රී ලංකා නැගෙනහිර විශ්ව විද්‍යාලයේ 2012 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්ය සාධනය පිළිබඳ ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති හා අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරු වල සාරාංශයකින් සමන්විත 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන 1978 අංක 16 දරන විශ්ව විද්‍යාල පනතේ 108(1) සහ 111 වගන්ති හා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3), (4) හා (7) උප වගන්ති සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුලත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. විශ්ව විද්‍යාල පනතේ 108(2) වගන්තිය හා මුදල් පනතේ 13(7) (අ) වගන්තිය ප්‍රකාර මෙම වාර්තාව නිකුත් කරනු ලැබේ.

1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍ය යැයි කළමනාකරණය විසින් තීරණය කරනු ලබන අභ්‍යන්තර පාලනය කළමනාකරණයේ වගකීම වේ.

1.3 විගණකගේ වගකීම

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිති වලට අනුකූලව මාගේ විගණනය සිදුකරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

අංක 306/72 පොල්දුව පාර, බත්තරමුල්ල , ශ්‍රී ලංකාව
இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை இலங்கை
No.306/72, Polduwa Road, Battaramulla , Sri Lanka

දුරකථනය / தொலைபேசி / Telephone. 2887028 - 34
ෆැක්ස් අංකය / பக்ஸ் இல / Fax No. 2887223
ඉලෙක්ට්‍රොනික් තැපැල් / ஈ- மெயில் / E-mail. oaggov@sltnet.lk

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාර වන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත්වේ.තෝරාගත් පරිපාටින්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීමද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම් වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම්කිරීම පිණිස විශ්ව විද්‍යාලයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාලවන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් විශ්ව විද්‍යාලයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය සහ ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) සහ (4) උපවගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාර බලතල පැවරේ.

මාගේ තත්ත්වාගණනය කළ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.4 **තත්ත්වාගණනය කළ විගණන මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

2. **මූල්‍ය ප්‍රකාශන**

2.1 **තත්ත්වාගණනය කළ විගණන මතය**

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශන වලින් 2012 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා නැගෙනහිර විශ්ව විද්‍යාලයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

2.2 **මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම්**

2.2.1 **ගිණුම්කරණ අඩුපාඩු**

විගණනයේදී පහත දැක්වෙන ගිණුම්කරණ අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) උපාධි අපේක්ෂක අධ්‍යාපනයේ අදාලත්වය හා ගුණාත්මක බව වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතිය (IRQUE) නිමකිරීමෙන් පසු එම ව්‍යාපෘතියේ වත්කම් විශ්ව විද්‍යාලයට භාරදී තිබුණද, එම වත්කම්වල වටිනාකම මූල්‍ය ප්‍රකාශන වල හෙළිදරව් කර නොතිබුණි.

(ආ) 2006 වර්ෂය තුළදී මධ්‍යම පරිසර අධිකාරියෙන් පරිත්‍යාග ලෙස ලැබී තිබුණු රු.9,555,427 ක් වටිනා රසායනාගාර උපකරණ ගිණුම්ගත කර නොතිබුණි.

2.2.2 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

විගණනයේදී නිරීක්ෂණය වූ අනුකූල නොවීම් අවස්ථා පහත දැක්වේ.

නීති , රීති , රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට යොමුව		අනුකූල නොවීම
(අ) මුදල් රෙගුලාසි		
(i).	මු.රෙ. 102	1990 වර්ෂය තුළදී සිදුවී තිබූ රු.17,860,815 ක් වූ පාඩු සම්බන්ධයෙන් අදාල පියවර ගෙන නොතිබුණි.
(ii).	මු.රෙ:371	වර්ෂ 1 සිට 17 දක්වා කාලයක් පැවති විවිධ කාර්යයන් සඳහා ගෙවන ලද එකතුව රු.මිලියන 14.61 ක් වූ අත්තිකාරම් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.
(iii).	මු.රෙ.756	සමාලෝචිත වර්ෂය අවසානයේදී විශ්ව විද්‍යාලයේ වත්කම් පිළිබඳ භෞතික සමීක්ෂණයක් සිදුකර නෙතිබුණි.
(iv).	මු.රෙ.1646	විශ්වි විද්‍යාලයේ වාහන වලට අදාල දෛනික ධාවන සටහන් වාර්තා විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

3

(ආ) විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව හා උසස් අධ්‍යාපන ආයතන සඳහා ආයතන සංග්‍රහය

(i).	X පරිච්ඡේදයේ 20.6 වගන්තිය	නිලධාරීන් විසින් ලබාගන්නා ලද වැටුප් රහිත නිවාඩු පිළිබඳ විස්තර මාසිකව පොදු ආකෘති 96 මඟින් විගණකාධිපතිට වාර්තා කර නොතිබුණි.
(ii).	XXVII පරිච්ඡේදයේ 3.1 වගන්තිය	විශ්ව විද්‍යාල අධ්‍යයන කාර්ය මණ්ඩලයේ පැමිණීම හා පිටවීම පැමිණීමේ ලේඛනයේ සටහන් කර නොතිබුණි.

3. මූල්‍ය සමාලෝචනය

3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවලට අනුව, සමාලෝචිත වර්ෂයේ විශ්ව විද්‍යාලයේ මෙහෙයුම් වලින් වූ ප්‍රතිඵලය පුනරාවර්තන වියදම් සඳහා රු.516,211,000 ක් වූ රජයේ ප්‍රදානය ගණන් ගැනීමෙන් පසුව රු.84,147,590 ක ඌනතාවයක් වූ අතර, ඊට අනුරූපව ඉකුත් වර්ෂයේ රු.437,448,075 ක් වූ රජයේ ප්‍රදානය ගණන් ගැනීමෙන් පසුව රු.59,498,212 ක ඌනතාවයක් වුයෙන් මූල්‍ය ප්‍රතිඵලයේ රු.24,649,378 ක තවදුරටත් පිරිහීමක් පෙන්නුම් කෙරුණි. ප්‍රධාන වශයෙන් මෙහෙයුම් වියදම් රු.96,267,379 කින් වැඩිවීම එම පිරිහීමට හේතුවී තිබුණි.

4. මෙහෙයුම් සමාලෝචනය

4.1 කාර්ය සාධනය

(අ) පවත්වන ලද විභාග වල ප්‍රතිඵල

ලබාගත හැකිවූ තොරතුරු අනුව සමාලෝචිත වර්ෂය තුළ පවත්වන ලද විභාග වලදී උපාධිලාභීන්ගේ කාර්ය සාධනය පහත දැක්වේ.

පීඨය	විභාග පවත්වන ලද කාලය	විභාග වලට පෙනී සිටි සිසුන් සංඛ්‍යාව (පළමු වසර සිට අවසන් වසර දක්වා)	සමත් වූ සිසුන් සංඛ්‍යාව (අවසන් වසර)
කෘෂිකර්මය	2012 මාර්තු , අප්‍රේල් , ඔක්තෝබර් , නොවැම්බර් සහ දෙසැම්බර්	175	27
කලා	2012 මාර්තු , අප්‍රේල් , ජූනි, ජූලි , ඔක්තෝබර් සහ නොවැම්බර්	1,220	333
වාණිජ හා කළමනාකරණය	2012 පෙබරවාරි , මාර්තු , අප්‍රේල් , මැයි , ජූනි, ජූලි , සැප්තැම්බර් , නොවැම්බර් සහ දෙසැම්බර්	716	91
විද්‍යා	2012 පෙබරවාරි , මාර්තු , අප්‍රේල් , ඔක්තෝබර්, නොවැම්බර් සහ දෙසැම්බර්	422	48
සෞඛ්‍ය ආරක්ෂණ විද්‍යාව	2012 පෙබරවාරි , මාර්තු , අප්‍රේල් , ඔක්තෝබර් , නොවැම්බර් සහ දෙසැම්බර්	238	27
එකතුව		2,771	526

(ආ) ඒක ශිෂ්‍ය පිරිවැය

විශ්ව විද්‍යාලය විසින් සමාලෝචිත වර්ෂය තුළ දරන ලද මුළු පුනරාවර්තන වියදම රු.482,847,281 ක් විය. වර්ෂයේ ඒක ශිෂ්‍ය සාමාන්‍ය පුනරාවර්තන පිරිවැය රු.174,376 ක් විය. ඉකුත් වර්ෂය සමඟ සැසඳීමේදී ඒක ශිෂ්‍ය පිරිවැය රු.43,705 කින් වැඩිවී තිබුණි.

(ඇ) මහපොළ හා ශිෂ්‍යාධාර

සමාලෝචිත වර්ෂය තුළදී ශිෂ්‍යයින් 5,503 දෙනෙකුට මහපොළ ආධාර ලෙස රු.11,833,100 ක් හා ශිෂ්‍යයින් 8,301 දෙනෙකුට ශිෂ්‍යාධාර ලෙස රු.16,598,400 ක් ගෙවා තිබුණි.

(ඈ) පුස්තකාල පරිපාලනය

පුස්තකාලයෙන් පොත් ලබාගත් අධ්‍යයන කාර්ය මණ්ඩලය හා ශිෂ්‍යයින් විසින් නිශ්චිත කාල පරිච්ඡේදය තුළදී පොත් 409 ක් ආපසු භාරදී නොතිබුණි. මෙම පොත් ආපසු ලබාගැනීම සඳහා මේ සම්බන්ධයෙන් විධිමත් ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

4.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ශිෂ්‍යත්ව මත විදේශගත වූ විශ්ව විද්‍යාලයේ කථිකාචාර්යවරුන් 57 ක් ශිෂ්‍යත්වය සම්පූර්ණ කිරීමෙන් පසුව විශ්ව විද්‍යාලයේ රාජකාරී සඳහා වාර්තා නොකර හෝ විශ්ව විද්‍යාලයෙන් ඉවත්ව ගොස් තිබුණි. කෙසේ වුවද ගිවිසුම් කඩ කිරීම් සම්බන්ධයෙන් කථිකාචාර්යවරුන් 57 ගෙන් රු.70,407,561 ක මුදලක් අයකර ගැනීමට විශ්ව විද්‍යාලය කටයුතු කර නොතිබුණි.

(ආ) අධ්‍යයන කාර්ය මණ්ඩලයේ පැවති පුරප්පාඩු 52 ක් පිරවීමට 2012 දෙසැම්බර් 31 දක්වා විශ්ව විද්‍යාලය විසින් පියවර ගෙන නොතිබුණි. එබැවින් එය ශිෂ්‍යයින්ගේ අධ්‍යයන කටයුතු සඳහා ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

(ඇ) පශ්චාත් - උපාධි ප්‍රදානය සඳහා 1978 අංක 16 දරන විශ්ව විද්‍යාල පනතේ 29 (ඇ) හා 29(ඉ) වගන්ති ප්‍රකාරව විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ අනුමැතිය 2012 දෙසැම්බර් 31 දක්වාත් ලබාගෙන නොතිබුණි. කෙසේ වුවද විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ අනුමැතියෙන් තොරව පශ්චාත් උපාධි පාඨමාලා 22 ක් පවත්වා තිබුණි.

(ඈ) රු.මිලියන 1.18 ක් වූ අත්තිකාරම් පුද්ගලයින් 54 දෙනෙකුට ගෙවා තිබුණු අතර, පුද්ගලයින් හඳුනා ගැනීමට හා අත්තිකාරම් ආපසු අයකර ගැනීමට කටයුතු කිරීමෙන් තොරව වර්ෂ 5 සිට 17 දක්වා වූ කාලයක් මෙම අත්තිකාරම් නිරවුල් නොකර පැවතුණි.

4.3 මෙහෙයුම් සමාලෝචනය

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) වෛද්‍ය උපකරණ ප්‍රසම්පාදනය.

සෞඛ්‍ය ආරක්ෂණ විද්‍යා පීඨයේ (FHCS) භාවිතය සඳහා සමාලෝචිත වර්ෂය තුළදී වටිනාකම රු.මිලියන 13.4 කට ඉන්දියාවේ පුද්ගලික සමාගමකින් වෛද්‍ය උපකරණ ප්‍රසම්පාදනය කර තිබුණි. මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) ප්‍රසම්පාදනය සඳහා ලංසුකරුවන් තිදෙනෙක් ලංසු ඉදිරිපත් කර තිබුණි. ලංසු තුනෙන් දෙකක් ව්‍යාජ ඒවා වූ අතර එක් ලංසුවක් ඇහළුම් උපාංග සැපයුම්කරුවකු ගෙන් විය.

(ii) ලංසුකරුවන් දෙදෙනෙකුගේ අනන්‍යතාවය ඔවුන්ගේ දුරකථන අංක හා ලිපිනයන් මගින් පමණක් විය.

(iii) "eight accessories of the tissue processor" නැමති වෛද්‍ය උපකරණය රු.මිලියන 4.5 ක පිරිවැයකට ප්‍රසම්පාදනය කර තිබුණද, ටිෂු ප්‍රොසෙසර්යේ (Tissue Processor) ප්‍රධාන අංගය නොමැතිවීම හේතුවෙන් මිලදීගත් දින සිට එය නිෂ්කාර්යව පැවතුණි .

(iv) මෙම උපකරණය සඳහා දේශීය සැපයුම්කරුවන් පිළිබඳ සැලකීමෙන් තොරව මිල කැඳවීම් තුනම ඉන්දියාවෙන් ලබාගෙන තිබුණි.

(v) ලබාගත හැකිවූ තොරතුරු අනුව ජාත්‍යන්තර වෙළඳපොලෙහි පවතින මිලට වඩා ඉහළ මිලක් මෙම උපකරණ සඳහා ගෙවා තිබුණි. උදාහරණ කිහිපයක් පහත දැක්වේ.

විෂයයේ නම	වෙළඳපල මිල (එජඩො)	ගැණුම් මිල (එජඩො)
මෘත ශරීරාගාර ශීතකරණ (Mortuary Chambers)	1320 සිට 7900 (පරාසය)	26,000
අල්ට්‍රා සවුන්ඩ් ස්කැනර් (Ultra Sound Scanner)	8,000 සිට 15,000	36,324
බයිනොකියුලර් මයික්‍රස්කෝප් (Binocular Microscope)	2,123 සිට 4,425	9,015

(ආ) පුස්තකාල ස්වයංකරණ කළමනාකරණ මෘදුකාංගය (Library Automation Management Software ("Libsys") එ ජ ඩො 27,400 (රු.මිලියන 3.2) කට ප්‍රසම්පාදනය කිරීම

2008 වර්ෂයේදී රු.මිලියන 3.2 ක පිරිවැයකට ඉන්දියාවේ හර්යානා හි එම්/එස් ලිබ්සිස් ටෙක්නොලොජිස් පිවිටී ලිමිටඩ් ආයතනයෙන් "ලිබ්සිස් " මෘදුකාංග පද්ධතිය ප්‍රසම්පාදනය කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේදී ගෙවීම සිදුකර තිබුණි. මේ සම්බන්ධයෙන් පහත අඩුපාඩු නිරීක්ෂණය විය.

(i) තාක්ෂණ ඇගයීම් කමිටුව (TEC) විසින් ප්‍රසම්පාදනය නිර්දේශ කර නොතිබුණි.

(ii) ප්‍රසම්පාදන කමිටුවේ (PC) අනුමැතිය ලබාගෙන නොතිබුණි.

(iii) විශ්ව විද්‍යාලය සැපයුම්කරු සමඟ ගිවිසුමකට එළඹ නොතිබුණි.

(iv) විශ්ව විද්‍යාලය සැපයුම්කරුගෙන් කාර්ය සාධන බැඳුම්කරයක් ලබාගෙන නොතිබුණි.

(v) කොන්ත්‍රාත් ලිපිය ප්‍රකාරව , සැපයුම්කරු විසින් " Linux System " සැපයිය යුතු විය. කෙසේ වුවද සැපයුම්කරු විසින් 2009 අප්‍රේල් 27 දින "Windows System" සපයා සවිකර තිබුණි.

(vi) දත්ත අපනයන හා ආනයන මොඩියුලය , වාර්තා උත්පාදනය කෙරෙන මොඩියුලය හා දත්ත බැක්අප් මොඩියුලය වැනි පද්ධති සංරචක නොමැතිවීම හේතුවෙන් "Libsy's" පද්ධතිය එහි සම්පූර්ණ ධාරිතාවයෙන් ක්‍රියාත්මක නොවූ බව භෞතික පරීක්ෂණයේදී අනාවරණය විය.

(vii) සැපයුම්කරුට ලැබිය යුතු එජඩො 10,960 (මුළු පිරිවැයෙන් 40%) ක් නොගෙවීම හේතුවෙන් සවිකිරීමෙන් පසු වර්ෂ 3 ක සහාය සේවාව සැපයුම්කරු විසින් සිදුකර නොතිබුණි.

(viii) මෙම පද්ධතිය රු.මිලියන 3.2 ක පිරිවැයකට 2008 වර්ෂයේදී ප්‍රසම්පාදනය කර තිබුණද, පද්ධතිය පුස්තකාලයේ සවිකර තිබුණේ 2009 අප්‍රේල් 27 දින දිය.

(ඈ) සෞඛ්‍ය ආරක්ෂණ පීඨයේ , හෙද උපාධි වැඩ සටහනට පහසුකම් සැපයීම සඳහා නෝර්වේහි "ට්‍රොම්සෝ " විශ්ව විද්‍යාලයෙන් රු.17,372,951 ක අරමුදල් ලැබී තිබුණද , මේ සම්බන්ධයෙන් විධිමත් වාර්තා පවත්වා නොතිබුණි. මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා විශ්ව විද්‍යාල පාලක සභාවෙන් හා සනාථන සභාවෙන් අනුමැතින් ලබාගෙන නොතිබූ බව වැඩිදුරටත් නිරීක්ෂණය විය.

5. ගිණුම් කටයුතු භාවය හා යහ පාලනය

5.1 අයවැය පාලනය

ඇයවැයගත වියදම හා තථ්‍ය වියදම අතර විශාල විචලනයන් නිරීක්ෂණය වුයෙන් අයවැය ලේඛනය ඵලදායි කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදාගෙන නොතිබූ බව නිරීක්ෂණය විය.

5.3 විගණන කමිටුව

සමාලෝචිත වර්ෂය තුළදී විගණන කමිටු රැස්වීම් 9 ක් පවත්වා තිබුණි. රැස්වීම් කිහිපයකදී විගණන විමසුම් වලට පිළිතුරු සපයන ලෙස කමිටුව නිර්දේශ කර තිබුණි. කෙසේ වුවද සමාලෝචිත වර්ෂය තුළ විගණකාධිපති විසින් නිකුත් කරන ලද විගණන විමසුම් 6 කට පිළිතුරු සැපයීමට කටයුතු කර නොතිබුණි.

6. පද්ධති හා පාලන

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින්වර විශ්ව විද්‍යාලයේ උපකුලපතිවරයාගේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු විය යුතු වේ.

(අ) ගිණුම්කරණය

(ආ) වත්කම් කළමනාකරණය

(ඇ) ගෙවීම් හා අත්තිකාරම් නිරවුල් කිරීම

(ඇ) ප්‍රසම්පාදන

එච්.ඒ.එස්.සමරවීර
විගණකාධිපති

21. 1978 අංක 16 දරණ විශ්වවිද්‍යාල පනතේ 108 (2) වගන්තිය හා 1971 අංක 38 දරණ මුදල් පනතේ 13 (7) (අ) වගන්තිය ප්‍රකාරව 2012 දෙසැම්බර් 31 වනදායින් අවසන් වූ වසර සඳහා ශ්‍රී ලංකා නැගෙනහිර විශ්වවිද්‍යාලයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව විගණකාධිපති වාර්තාවට කළමනාකරණය මගින් ලබා දී ඇති පිළිතුරු.

විගණන ඡේදයට යොමුව හා පාලන අධිකාරියේ කළමනාකරණ නිරීක්ෂණ		නිරීක්ෂණ
2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම්		
ගිණුම්කරණ අඩුපාඩු		
අ.	උපාධි අපේක්ෂක අධ්‍යාපනයේ අදාලත්වය හා ගුණාත්මක බව වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතිය (IRQUE) නිමකිරීමෙන් පසු එම ව්‍යාපෘතියේවත්කම් විශ්වවිද්‍යාලට භාරදී තිබුණද, එම වත්කම්වල වටිනාකම මූල්‍ය ප්‍රකාශන වල හෙළිදරවු කර නොතිබුණි.	උසස් අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්තුමාගේ 15.09.2010 දිනැති ලිපිය ප්‍රකාරව, ශ්‍රී ලංකා නැගෙනහිර විශ්වවිද්‍යාලයේ IRQUE ව්‍යාපෘතියේ LTS කාර්‍යාලය විසින් IRQUE ව්‍යාපෘතිය මගින් ප්‍රතිසම්පාදනය කරන ලද සියළු වත්කම් අදාල දෙපාර්තමේන්තුවලට පවරා දී තිබේ. තවද මූල්‍ය වාර්තාවල සඳහන් වත්කම්හි ප්‍රාග්ධනීකරනය, LTS කාර්‍යාලයේ භාණ්ඩ ලේඛනයේ සඳහන් වන IRQUE ව්‍යාපෘතිය මගින් ප්‍රතිසම්පාදනය කරන ලද වත්කම්වල වටිනාකම අවසන් ගිණුමට ලබා ගැනීමේදී එහි වටිනාකම සඳහා ක්ෂය වූ වටිනාකමද, පිරිවැය වටිනාකමද යන්න එම ලිපියේ පැහැදිලිව සඳහන් වී නොතිබිනි.
ආ.	2006 වර්ෂය තුළදි මධ්‍යම පරිසර අධිකාරියෙන් පරිත්‍යාග ලෙස ලැබී තිබුණු රු. 9,555,427 ක් වටිනා රසායනාගාර උපකරණ ගිණුම්ගත කර නොතිබුණි.	විගණකාධිපතිගේ ප්‍රකාශය පිළිගනු ලැබේ. නැගෙනහිර විශ්වවිද්‍යාලය පෞද්ගලික සේවා සපයන්නකු මගින් ස්ථාවර වත්කම් ගිණුම්ගත කිරීමට කටයුතු කර ඇත. මෙම ක්‍රියාමාර්ගය සම්පූර්ණ වූ විගස අවසන් ගිණුමට ඇතුලත් කිරීමට නියමිතයි.
2:2:3 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම		
අ. මුදල් රෙගුලාසි		
	I. මු.රෙ. 102 1990 වර්ෂය තුළදි සිදුවී තිබු රු.17,860,815 ක් වු පාඩු සම්බන්දයෙන් අදාළ පියවර ගෙන නොතිබුණි.	පොතෙන් කපා හැරීම සඳහා අනුමැතිය ලබා ගැනීමට සියලුම ලේඛන මේ වන විටත් අදාල නිලධාරින් වෙත ඉදිරිපත් ඇත.

	II. මු.රෙ. 371 වර්ෂ 1 සිට 17 දක්වා කාලයක් පැවති විවිධ කාර්යයන් සඳහා ගෙවන ලද එකතුව රු.මිලියන 14.61 ක් වූ අත්තිකාරම් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.	1. **අභ්‍යන්තර සේවකයන් විසින් ලබා ගත් අත්තිකාරම්.** අත්තිකාරම් මුදල ගෙවීමට අපොහොසත් අයගේ වැටුපෙන් හෝ විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදලෙන් අය කරගැනීම සඳහා පියවර ගෙන ඇත. 2. **සැපයුම්කරුවන් විසින් ලබා ගත් අත්තිකාරම්.** මේ සම්බන්ධයෙන් අධ්‍යනය කොට වාර්තාවක් ලබා දීමට කමිටුවක් පත්කර ඇත. කමිටුවේ නිර්දේශය මත කටයුතු කරනු ලැබේ.
	III. මු.රෙ. 756 සමාලොචිත වර්ෂය අවසානයේදී විශ්වවිද්‍යාලයේ වත්කම් පිළිබඳ භෞතික සමීක්ෂණයක් සිදුකර නොතිබුණි.	2012 වසර සඳහා වන භෞතික සත්‍යාපනය දැන් සිදුවෙමින් පවති.
	IV. මු.රෙ. 1646 විශ්වවිද්‍යාලයේ වාහන වලට අදාල දෛනික ධාවන සටහන් වාර්තා විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.	වාහන සම්බන්ධ දෛනික ධාවන සටහන් මේ වනවිටත් යාවත්කාලීන කරමින් ප්‍රධාන විගණන කාර්‍යාලයට විධිමත් ආකාරයට භාර දීමට කටයුතු කොට ඇත.
ආ. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව හා උසස් අධ්‍යාපන සඳහා ආයතන සංග්‍රහය		
	i. X පරිච්ඡේදයේ 20.6 වගන්තිය නිලධාරින් විසින් ලබාගන්නා ලද වැටුප් රහිත නිවාඩු පිළිබඳ විස්තර මාසිකව පොදු ආකෘති 96 මහන් විගණකාධිපතිට වාර්තා කර නොතිබුණි. ii. XXVII පරිච්ඡේදයේ 3.1 වගන්තිය විශ්වවිද්‍යාල අධ්‍යයන කාර්ය මණ්ඩලයේ සටහන් කර නොතිබුණි.	i. අපි එකඟ වෙන අතර සියළුම වැටුප් රහිත නිවාඩු පිළිබඳ විස්තර විගණකාධිපතිවරයා වෙත වාර්තා කිරීමට කටයුතු කරනු ලැබේ. ii. සම්ප්‍රදායානුකූලව අධ්‍යන කාර්‍ය මණ්ඩලය ඔවුන්ගේ පැමිණීම සටහන් නොකරයි. එනමුත් නිවාඩු විස්තර පීඨ මට්ටමෙන් පවත්වාගෙන යයි.

3 මූල්‍ය සමාලෝචනය

3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන වලට අනුව, සමාලොචිත වර්ෂයේ විශ්වවිද්‍යාලයේ මෙහෙයුම් වලින් වූ ප්‍රතිඵලය පුනරාවර්තන වියදම් සඳහා රු.516,211,000 ක් වූ රජයේ ප්‍රදානය ගණන් ගැනීමෙන් පසුව රු. 84,147,590 ක ඌනතාවයක් වූ අතර, ඊට අනුරූපව	අවධානයට ගෙන ඇත.

4. මෙහෙයුම් සමාලෝචනය		
4.1. කාර්ය සාධනය		
අ.	පවත්වන ලද විභාග වල ප්‍රතිඵල	ඔබගේ මෙම ප්‍රකාශය සමඟ අපි එකඟ නොවෙමු. විභාගයට පෙනී සිටි මුළු ශිෂ්‍යයන් ලෙස සියළුම පීඨවල පළමු වසර සිට සිව්වන වසර දක්වා ශිෂ්‍යයන් ද, පාඨමාලාව සමත් ශිෂ්‍යයන් ලෙස අවසන් වසර ශිෂ්‍යයන් පමණක් ද පෙන්වා දී තිබුනි.
ආ.	ඒක ශිෂ්‍ය පිරිවැය	සේවකයන්ගේ වේතන, ප්‍රාග්ධන වත්කම් සහ කොන්ත්‍රාත්තු සේවා ආදියේ ප්‍රතිපාදන ඉහළ ගොස් ඇති බැවින් එක් ශිෂ්‍යයෙකු සඳහා වන වියදම වැඩි වී ඇත.
ඇ.	මහපොළ හා ශිෂ්‍යාධාර	අවධානයට ගෙන ඇත.
ඈ.	පුස්තකාල පරිපාලනය පුස්තකාලයෙන් පොත් ලබාගත් අධ්‍යයන කාර්ය මණ්ඩලය හා ශිෂ්‍යයින් විසින් නිශ්චිත කාල පරිච්ඡේදය තුලදී පොත් 409 ක් ආපසු භාරදී නොතිබුණි. මෙම පොත් ආපසු ලබාගැනීම සඳහා මේ සම්බන්ධයෙන් විධිමත් ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.	පුස්තකාලයෙන් පොත් ලබාගත් සියල්ලන් හට සිහි කැඳවීම් ලිපි යවා ඇත. තවද පොත්වල වටිනාකම අයකර ගැනීමට පුස්තකාල කමිටුව මගින් ක්‍රියාමාර්ග ගනු ලැබේ.
4.2 කළමනාකරණ අකාර්යක්ෂමතා		
අ.	ශිෂ්‍යත්ව මත විදේශගත වු විශ්වවිද්‍යාලයේ කථිකාචාර්යවරුන් 57 ක් ශිෂ්‍යත්වය සම්පූර්ණ කිරීමෙන් පසුව විශ්වවිද්‍යාලයේ රාජකාරි සඳහා වාර්තා නොකර හෝ විශ්වවිද්‍යාලයෙන් ඉවත්ව ගොස් තිබුණි. කෙසේ වුවද ගිවිසුම් කඩ කිරීම් සම්බන්ධයෙන් කථිකාචාර්යවරුන් 57 ගෙන් රු.70,407,561 ක මුදලක් අයකර ගැනීමට විශ්වවිද්‍යාලය කටයුතු කර නොතිබුණි.	○ බැඳුම්කර පැහැර හැරීම් 72 සම්බන්ධ නඩු 12 ක් ඇටර්නි ජෙනරාල් දෙපාර්තමේන්තුව වෙත නීතිමය ක්‍රියාමාර්ග සඳහා සහ ඔවුන්ගෙන් අයවිය යුතු මුදල අයකර ගැනීම සඳහා බාර දී ඇත. මෙම නඩුව රජයේ නීතිඥවරයන් දෙදෙනෙක් මෙහෙයවයි. රුපියල් මිලියන 7.8 ක් පමණ මේ වනවිට අයකර ඇත. ○ ජොෂ්ඨ කළමනාකරණ කමිටුව එහි 19 වන හා 20 වන කමිටු රැස්වීමේදී බැඳුම්කර පැහැර හැර විදේශ ගත වී සිටින්නන්ගේ පදිංචි ස්ථානය සොයා ගැනීම සඳහා අදාල තානාපති කායීලවල සහය ලබා ගැනීමට නිර්දේශ කර ඇත. ○ මෑතකදී නිතීපති දෙපාර්තමේන්තුව වසර 10 ඉක්මවූ නඩු පිළිබඳ ඉදිරියේදී කිසිදු ක්‍රියාමාර්ගයක් ගත නොහැකි බව දන්වා ඇත. නමුත් 24.10.2012 වන දින පැවැත් වුනු 15 වන විගණන කමිටු රැස්වීමේදී ගත් නිර්දෙශ අනුව සභාපති/ වි.ප්‍ර.කො. සභාව සහ ලේකම්/උ.අ.අමාත්‍යාංශය ආදිය හරහා නිතීපතිවරයා වෙත වසර 10 ඉක්ම වූ නඩු ඉදිරියට පවත්වා ගෙන යන ලෙසට ඉල්ලිමක් කරන ලදී.

ආ.	අධ්‍යයන කාර්ය මණ්ඩලයේ පැවති පුරප්පාඩු 50 ක් පිරවීමට 2012 දෙසැම්බර් 31 දක්වා විශ්වවිද්‍යාලය විසින් පියවර ගෙන නොතිබුණි. එබැවින් එය ශිෂ්‍යයිනේග් අධ්‍යයන කටයුතු සඳහා ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.	බොහෝ පුරප්පාඩු මේ වන විට පුරවා ඇත. සමහර මහාචාර්ය පුරප්පාඩු සුදුස්සන් නොමැති බැවින් පිරවීමට නොහැකි වී ඇත.
ඇ.	පශ්චාත්-උපාධි ප්‍රදානය සඳහා 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 29 (ඇ) හා 29 (ඉ) වගන්ති ප්‍රකාරව විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ අනුමැතිය 2012 දෙසැම්බර් 31 දක්වාත් ලබාගෙන නොතිබුණි. කෙසේ වුවද විශවවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ අනුමැතියෙන් තොරව පශ්චාත් උපාධි පාඨමාලා 22 ක් පවත්වා තිබුණි.	මෙයට අපි එකඟවන්නෙමු. මෙය නිවැරැදි කිරීම සඳහා ක්‍රියාමාර්ග ගෙන ඇති අතර විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිසම් සභාවේ අනුමැතියද ලබා ගැනීමට කටයුතු කොට ඇත.
ඇ.	රු.මිලියන 1.18 ක් වූ අත්තිකාරම් පුද්ගලයින් 54 දෙනෙකුට ගෙවා තිබුණු අතර, පුද්ගලයින් හඳුනා ගැනීමට හා අත්තිකාරම් ආපසු අයකර ගැනීමට කටයුතු කිරිමෙන් තොරව වර්ෂ 5 සිට 17 දක්වා වූ කාලයක් මෙම අත්තිකාරම් නිරවුල් නොකර පැවතුණි.	හඳුනානොගත් අත්තිකාරම් සම්බන්ධයෙන් නිසි පරීක්ෂණ පවත්වා අදාල බලධාරින්ගේ අනුමැතිය සමඟ කාපා හැරීමට කටයුතු කරනු ලැබේ.
4.3 මෙහෙයුම් සමාලෝචනය		
අ.	වෛද්‍ය උපකරණ ප්‍රසම්පාදනය	පාලක සභාව විසින් පත් කරනු ලැබූ විමර්ශන කමිටුව තමන්ගේ වාර්තාව පාලක සභාවට ඉදිරිපත් කර ඇත. ඔවුන්ගේ නිර්දේශය මත ක්‍රියාමාර්ග ගනු ලැබේ.
ආ.	පුස්තකාල ස්වයංකරණ කළමනාකරණ මෘදුකාංගය (Library Automation Management Software ("Libsys") එ.ජ.ඩො. 27,400 (රු.මිලියන 3.2) කට ප්‍රසම්පාදනය කිරිම	විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිසම් සභාවේ පුස්තකාල සහ තොරතුරු විද්‍යා ස්ථාවර කමිටුවේ නිර්දේශය මත "Libsys" මෘදුකාංග පද්ධතිය මිල දී ගන්නා ලදී. වලංගු ගිවිසුමක් අත්සන් කළ නොතිබුනු බව අපි පිලිගන්නෙමු. ඒ නමුත් ගිවිසුම අත්සන් කර පැවති අඩුපාඩු නිවැරැදි කර ඉතිරි මුදල ගෙවීම සඳහා කටයුතු කරනු ලැබේ.
ඇ.	සෞඛ්‍ය ආරක්ෂණ පීඨයේ, හෙද උපාධි වැඩ සටහනට පහසුකම් සඳහා නොර්වේහි "ට්‍රොම්සෝ" විශ්වවිද්‍යාලයෙන් රු.17,372,951 ක අරමුදල් ලැබී තිබුණද, මේ සම්බන්ධයෙන් විධිමත් වාර්තා පවත්වා නොතිබුණි. මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා විශ්වවිද්‍යාල පාලක සභාවෙන් හා සනාථන සභාවෙන් අනුමැතින් ලබාගෙන නොතිබු බව වැඩිදුරටත් නිරීක්ෂණය විය.	24.09.2012 වන දින පැවැත්වුනු 15 වන විගණන කමිටු රැස්වීමේදී, "ව්‍යාපෘතිය අවසන් වී ඇති බැවින් ව්‍යාපෘති පරිපාලනය මගින් අනුගමනය කරන ලද වැරැදි ක්‍රියාමාර්ගයන් නිවැරැදි කළ නොහැකි බව එම කමිටුව ඉදිරිපත් කර ඇත. එබැවින් අවම වශයෙන් ව්‍යාපෘති මුදල්වලට කුමක් සිදු වී ඇතිද යන්න දැන ගැනීම සඳහා විමර්ශන කටයුතු සිදු කරන ලෙසට විගණන කමිටුව උපදෙස් ලබා දී ඇත. විගණන කමිටුව විසින් ඒක පුද්ගල විමර්ශන කමිටුවක් නිර්දේශ කර එහි පරීක්ෂණ පවත්වා ගෙන යනු ලැබේ.

5. ගිණුම් කටයුතු භාවය හා යහ පාලනය		
5.1. අයවැය පාලනය		
	අයවැයගත වියදම් හා තථ්‍ය වියදම් අතර විශාල විචලනයන් වුයෙන් අයවැය ලේඛනය ඵලදායි කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදාගෙන නොතිබු බව නිරීක්ෂණය විය.	විගණකාධිපතිගේ ප්‍රකාශනය පිළිගනු ලැබේ. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ 03/2011 අංකය දරන 14.03.2011 දිනැති චක්‍රලේඛය ප්‍රකාර, අධ්‍යයන කාය්‍ය මණ්ඩලයේ දීමනා වැඩිවීම විශාල විචලනයට හේතු වී තිබුනි.
5.2. විගණන කමිටුව		
	සමාලෝචිත වර්ෂය තුළදි විගණන කමිටු රැස්වීම් 9 ක් පවත්වා තිබුණි. රැස්වීම් කිහිපයකදි විගණන විමසුම් වලට පිළිතුරු සපයන ලෙස කමිටුව නිර්දේශ කර තිබුණි. කෙසේ වුවද සමාලෝචිත වර්ෂය තුළ විගණකාධිපති විසින් නිකුත් කරන ලද විගණන විමසුම් 6 කට පිළිතුරු සැපයිමට කටයුතු කර නොතිබුණි.	ඉතිරි විගණන ප්‍රශ්ණවලට පිළිතුරු සැපයීම සඳහා අපි ක්‍රියාමාර්ග ගෙන ඇත.
6. පද්ධති හා පාලන		
	විගණනයේදී නිරීක්ෂණය වු පද්ධති හා පාලන අඩුපාඩු වරින්වර විශ්වවිද්‍යාලයේ උපකුලපතිවරයාගේ අවධානයට යොමු කරන ලදි. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු විය යුතු වේ. (අ) ගිණුම්කරණය (ආ) වත්කම් කළමනාකරණය (ඇ) ගෙවීම් හා අත්තිකාරම් නිරවුල් කිරීම (ඇ) ප්‍රසම්පාදන	අවධානයට ගෙන ඇත.

ආචාර්ය. කේ. කෝබින්දරාජා
උපකුලපති